# (57) නාට්‍ය හා රංග කලාව (සිංහල)

**ප්‍රශ්න පත්‍ර ව්‍යුහය**

**I පත්‍රය - පෙරදිග නාට්‍ය කලාව**

**කාලය : පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10 යි.)

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත වේ.

I කොටස - වරණ **5** බැගින් වූ බහුවරණ ප්‍රශ්න **40**කි. ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් මුළු ලකුණු 40කි.

II කොටස - මෙම කොටස අනු කොටස් **දෙකකින්** සමන්විත වේ.

A කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **තුනකි.**

B කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **තුනකි.**

එක් කොටසකින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **4**කට පිළිතුරු සැපයිය යුතු ය.

එක් ප්‍රශ්නයකට ලකුණු **15** බැගින් **මුළු ලකුණු 60 කි.**

**I පත්‍රය සඳහා මුළු ලකුණු** - 100

**II පත්‍රය - අපරදිග නාට්‍ය කලාව**

**කාලයඃ පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10 යි.)

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත වේ.

I කොටස - වරණ **5** බැගින් වූ බහුවරණ ප්‍රශ්න **40කි.** ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **1** බැගින් **මුළු ලකුණු** 40කි.

II කොටස - මෙම කොටස අනු කොටස් **දෙකකින්** සමන්විත වේ.

A කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **තුනකි.**

B කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **තුනකි.**

එක් කොටසකින් ප්‍රශ්න **2** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.

එක් ප්‍රශ්නයකට ලකුණු **15** බැගින් **මුළු ලකුණු** 60කි.

**II පත්‍රය සඳහා මුළු ලකුණු** - 100

**ප්‍රායෝගික පරීක්ෂණය**

නාට්‍ය හා රංග කලා විෂයේ ප්‍රායෝගික ඇගැයීම, **A, B, C** සහ **D** යනුවෙන් කොටස් හතරකින් සමන්විත වේ. **A** කොටසට අපේක්ෂකයා අනිවාර්යයෙන් ම ඉදිරිපත් විය යුතු අතර උපරිම ලකුණු 60ක් උපයාගත යුතු ය. **B** කොටසේ ඇගැයීම් අතරින් අපේක්ෂකයා කැමති එක් ඇගැයීමකට (ලකුණු 15) සහ **C** කොටසේ ඇගැයීම් අතරින් අපේක්ෂකයා කැමති එක් ඇගැයීමකට (ලකුණු 15) අයදුම්කරු ඉදිරිපත් විය යුතු ය. **D** කොටස යනු වාචා පරීක්ෂණයකි. මේ සඳහා **B** සහ **C** කොටස් ඇසුරෙන් පරීක්ෂක මණ්ඩලය විමසන වාචික ප්‍රශ්න සඳහා අපේක්ෂකයා පිළිතුරු ලබා දිය යුතු ය (ලකුණු 10).

| | | |
|---|---|---|
| **A කොටස** | **රූපණය/රගපෑම (Acting) - ලකුණු 60** | |
| A - 1 | පෙළ ආශ්‍රිත භාෂණ රංගනය (දෙන ලද පෙළ කොටස් ඇසුරෙන්) | ලකුණු 30 |
| A - 2 | එසැණ නිරූපණය | ලකුණු 15 |
| A - 3 | කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම | ලකුණු 15 |
| **B කොටස** | **රූපණය/රගපෑම (Acting) - ලකුණු 15** | |
| B - 1 | සංගීත ඛණ්ඩයකට අනුව ඉදිරිපත් කරන නිර්මාණාත්මක රංගනය | ලකුණු 15 |
| B - 2 | නාට්‍ය ගීතයක් ගායනයෙන් හා රංගනයෙන් ඉදිරිපත් කිරීම | ලකුණු 15 |
| B - 3 | ගැමි නාටක/ශාන්තිකර්ම ආශ්‍රිත චරිත නිරූපණය | ලකුණු 15 |
| **C කොටස** | **නාට්‍ය නිෂ්පාදනය සහ ආනුෂංගික කලා පිළිබඳ ඇගයීම - ලකුණු 15** | |
| C - 1 | අංග රචන නිර්මාණ සැලසුම (Makeup Design) | ලකුණු 15 |
| C - 2 | වේෂ භූෂණ නිර්මාණ සැලසුම (Costume Design) | ලකුණු 15 |
| C - 3 | පසුතල නිර්මාණ සැලසුම (Set Design) | ලකුණු 15 |
| **D කොටස** | **ඉහත B සහ C කොටසට අදාල වාචා පරීක්ෂණය - ලකුණු 10** | |

අවසාන ලකුණු ගණනය කිරීම:

| | | |
|---|---|---|
| I පත්‍රය | = | ලකුණු 100 |
| II පත්‍රය | = | ලකුණු 100 |
| ප්‍රායෝගික පරීක්ෂණය | = | ලකුණු 100 |
| අවසාන ලකුණු | = | ලකුණු 300 ÷ 3 = 100 |

Artsapi.lk
Download All Pastpapers from Artsapi.lk

# (57) නාට්‍ය හා රංග කලාව (සිංහල)

I පත්‍රය

**සැලකිය යුතුයි:**

★ නිවැරදි පිළිතුර තෝරා එම පිළිතුරේ අංකය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.

---

**I කොටස**

**1.** ප්‍රාසංගික කලා පමණක් අන්තර්ගත ගොනුව තෝරන්න.
(1) වීදි නාට්‍ය, සංගීතය, මූර්ති කලාව, ටෙලි නාට්‍ය, ඔපෙරා
(2) ගීත නාටක, වේදිකා නාට්‍ය, ඔපෙරා, බැලේ, නෘත්‍ය නාටක
(3) චිත්‍ර කලාව, සංගීත නාටක, ඔපෙරා, ගැමි නාටක, ගුවන් විදුලි නාට්‍ය.
(4) නර්තනය, සංගීතය, ගුවන් විදුලි නාට්‍ය, වීදි නාට්‍ය, සිනමාව
(5) සිනමාව, ටෙලි නාට්‍ය, වීදි නාට්‍ය, ඔපෙරා, බැලේ. (......)

**2.** නෘත්ත, නෘත්‍ය, නාට්‍ය වශයෙන් දැක්වෙන අර්ථ නිරූපණය පිළිබඳ ව පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් **නිවැරදි** පිළිතුර තෝරන්න.
(1) නෘත්‍යයෙන් කිසිදු භාවයක් ප්‍රකට නොකෙරේ.
(2) නාට්‍යය, නෘත්ත හා නෘත්‍ය තරම් ප්‍රබල නැත.
(3) භරතමුනි මේ පිළිබඳ ව කිසිවක් සඳහන් නො කර යි.
(4) නාට්‍යයට නෘත්ත හා නෘත්‍යයේ සහාය අවශ්‍ය නැත.
(5) නෘත්ත යනු ශුද්ධ නැටුම හෙවත් රිද්මයානුකූල ගාත්‍ර වික්ෂේපයක් පමණි. (......)

**3.** 'නාට්‍යධර්මී' සම්බන්ධයෙන් **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.
(1) ලාලිත්‍යයෙන් යුතු අංග වික්ෂේප නාට්‍යධර්මී ලෙස හැඳින්විය හැකි ය.
(2) ජනාන්තික, අපවාරිත, ආකාශභාෂිත ආදිය නාට්‍යධර්මීගත භාෂණවිධි ය.
(3) ද්විත්ව රංගනය (double acting) ද නාට්‍යධර්මීගත රඟපෑමකි.
(4) නාට්‍යධර්මීගත සියලු රඟපෑම් ශෛලිගත රඟපෑම් ලෙස හැඳින්විය හැකි ය.
(5) යාන - වාහන, වන ගහන ආදිය සජීවී නළුවන් ලවා ඉදිරිපත් කිරීම ද නාට්‍යධර්මී ලෙස හැඳින්වේ.
(......)

**4.** 'නාට්‍යශාස්ත්‍රය' කෘතිය සම්බන්ධ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) සංස්කෘත නාට්‍යයේ ප්‍රේක්ෂා ගෘහය සම්බන්ධ දීර්ඝ විස්තරයක් මෙම කෘතියෙහි අඩංගුය.
(2) භරත නම් මුනිවරයා විසින් ක්‍රි.ව. 10 සියවසේ දී පමණ රචනා කරන ලදැ යි සැලකේ.
(3) චතුර් අභිනය පිළිබඳ ව දීර්ඝ ලෙස විස්තර නොවේ.
(4) මෙහි නර්තනය ගැන සඳහන් වුව ද සංගීතය ගැන සඳහන් නොවේ.
(5) අපරදිග නාට්‍ය කලාවට ගුරු වූ සංස්කෘත විචාර ග්‍රන්ථයකි. (......)

**5.** නාට්‍ය කලාවේ සෑම පැතිකඩක් ම අළලා ලියැවුණු ලොව ප්‍රථම විචාර ග්‍රන්ථය වනුයේ,
(1) ඇරිස්ටෝටල්ගේ පොයියිටිකීස් හෙවත් කාව්‍යශාස්ත්‍රයයි.
(2) භරතමුනිගේ නාට්‍යශාස්ත්‍රයයි.
(3) ධනංජයගේ දශරූපයයි.
(4) ලියෝ තෝල්ස්තෝයිගේ කලාව යනු කුමක් ද? යන ග්‍රන්ථයයි.
(5) සෙඅමි මෙතොකියෝගේ පුෂිකදෙන් නම් කෘතියයි. (......)

**6.** දේශීය ශාන්තිකර්ම සම්බන්ධ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) රටයකුම හෙවත් රිද්දියාගය උඩරට ප්‍රදේශයේ ප්‍රචලිත ශාන්තිකර්මයකි.
(2) සිංහල වේදිකා නාට්‍යයට දේශීය ශාන්තිකර්මවලින් ආභාසයක් ලැබී නැත.
(3) දේශීය ශාන්තිකර්ම නාට්‍යමය ලක්ෂණයෙන් හීන ය.
(4) එදිරිවීර සරච්චන්ද්‍ර දේශීය ශාන්තිකර්ම ගැන පර්යේෂණ සිදුකොට නැත.
(5) රෝග නිවාරණය හා සශ්‍රීකත්වය දේශීය ශාන්තිකර්ම පැවැත්වීමේ අරමුණයි. (......)

Download All Pastpapers from Artsapi.lk

**7.** දේශීය ශාන්තිකර්මවල රඟමඬුලු සැරසිලි සම්බන්ධ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න
(1) සූනියම් යාගය සඳහා වීදී සැරසිලි නිර්මාණය නොකෙරේ.
(2) සන්නියකුම යාගයේ වෙස්මුහුණු භාවිතා වන බැවින් රංගභූමි සැරසිලි භාවිතා නො කෙරේ.
(3) රඟමඩුලු සැරසිලි ශාන්තිකර්මයේ උපත් කතාව හා සම්බන්ධයක් නැත.
(4) ශාන්තිකර්ම රඟමඩලේ ඉදි කරන මඩු, වීදී, තොරණ ආදිය පසුතල නිර්මාණ වේ.
(5) රඟමඩලු සැරසිලි නිර්මාණය වන්නේ දැව භාවිතයෙනි. (......)

**8.** සොකරි නාට්‍යයට අදාළ **නොගැළපෙන** වරණය තෝරන්න.
(1) සොකරි වූ කලී උඩරට ප්‍රදේශවල ප්‍රචලිත ගැමි නාටකයකි.
(2) එහි එන ප්‍රධාන චරිත නාම විදේශීය සම්භවයකට නෑකම් කියයි.
(3) එය රෝග නිවාරණ ශාන්තිකර්මයක් ලෙස නොසැලකේ.
(4) රඟ දැක්වීම සඳහා බහුල ව භාවිතා වන්නේ කමතයි.
(5) එහි එන ඇතැම් චරිත තාවකාලික ව සකස් කරගන්නා වෙස් මුහුණු භාවිතා කෙරෙති. (......)

**9.** කෝළම් නාටකයට සම්බන්ධ **නිවැරදි** වරණය තෝරන්න.
(1) මහාකෝල සන්නි යකා කෝළම් නාටකයේ චරිතයකි.
(2) කෝළම් නාටකයේ වඩාත් ම විචිත්‍ර අංගය වන්නේ පූර්වරංගයයි.
(3) කෝළම් නාටකයට ස්ත්‍රී චරිත අන්තර්ගත නොවේ.
(4) දහඅට සන්නිය හා කෝළම් අතර සමානතාවක් නැත.
(5) පූර්වරංගයේ පාත්‍ර වර්ගයා සඳහා පමණක් වෙස් මුහුණු භාවිතා කෙරේ. (......)

**10.** නාඩගම ගැමි නාටකයක් **නොවන්නේ,**
(1) ගැමි පරිසරයක් තුළ රඟ නොදැක්වුණු නිසා ය.
(2) ඊට පූර්වරංගයක් අයත් වූ නිසා ය.
(3) ඊට ලිඛිත පිටපතක් යොදා ගැනුණු නිසා ය.
(4) ඊට කර්ණාටක සංගීතය යොදා ගැනුණු නිසා ය.
(5) දකුණු ඉන්දීය තෙරුක්කුත්තුවල ආභාසය ලද නිසා ය. (......)

**11.** නාඩගමට පමණක් **ආවේණික** ස්ථාවර පාත්‍ර අයත් වරණය තෝරන්න.
(1) ආඬිගුරු, බහුබූතයා, සොත්තානා, හේවා කෝළම
(2) බහුබූතයා, සෙල්ලම් ළමා, දේශනාවාදී, පොතේගුරු
(3) පොතේගුරු, දේශනාවාදී, බම්මන්නා, හනුමන්තා
(4) පරයා, සොත්තානා, ආඬිගුරු, සෙල්ලම් ළමා
(5) බහුබූතයා, සොත්තානා, ලෙන්චිනා, ආඬිගුරු (......)

**12.** නූර්ති සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරින් **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) නූර්තිය මෙරට ප්‍රචලිත කළෝ යුරෝපීය ජාතිකයෝ ය.
(2) සී.දොන් බස්තියන් ජයවීර නූර්ති රචකයෙක් නොවේ.
(3) රංගනයේ යෙදුණේ පුරුෂයන් පමණි.
(4) එලිමහනේ රඟ දක්වනු ලැබිණි.
(5) රොම්ලින් සහ ඇහැලේපොළ නූර්ති නාට්‍ය දෙකකි. (......)

**13.** ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය සම්බන්ධ **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) ලෙස්ලි බොතේජු සහ ක්ලෙමන්ට් ප්‍රනාන්දු පාස්කු නාට්‍ය රචකයෝ ය.
(2) බොරලැස්ස පාස්කු වේදිකා නාට්‍ය සම්ප්‍රදාය ඇරඹුවේ ලෝරන්ස් පෙරේරා ය.
(3) දූවේ පාස්කු නාට්‍ය සඳහා නාඩගම් ශෛලිය ආභාසය වී නැත.
(4) දූවේ පාස්කු නාට්‍ය සඳහා භාවිත වන්නේ මර්සලීන් ජයකොඩි පියතුමාගේ පාස්කු පිටපතයි.
(5) දූවේ පාස්කු නාට්‍ය වර්තමානයේ ද රඟ දැක්වේ. (......)

Download All Pastpapers from Artsapi.lk

**14.** ''සුවඳ පද්ම ඕළු ආදි'' ගීතය අන්තර්ගත ව ඇත්තේ,

(1) ඇහැලේපොළ නාඩගමේ ය.
(2) චාල්ස් ඩයස්ගේ පද්මාවතී නූර්තියෙහි ය.
(3) ජෝන් ද සිල්වාගේ රාමායණයෙහි ය.
(4) බ්‍රම්ෆෝඩ් නාඩගමේ ය.
(5) චාල්ස් ඩයස්ගේ දුටුගැමුණු නූර්තියේ ය. (......)

**15.** ශ්‍රී ලංකාවේ බෞද්ධ පූජාකර්ම සම්බන්ධ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) මිලින්ද ප්‍රශ්නය ධර්ම දේශනයක ස්වරූපයෙන් ඉදිරිපත් වන බෞද්ධ පූජාකර්මයකි.
(2) දොරකඩ අස්න නාට්‍යමය ගුණයෙන් හීන පූජා කර්මයකි.
(3) යුගාසන බණ භික්ෂූන් දෙදෙනෙකු අතර සිදුවන සංවාදයක ස්වරූපය ගනී.
(4) ආලවක දමනය රඟ දක්වන්නේ රූකඩ උපයෝගී කොට ගෙන ය.
(5) බෞද්ධ පූජාකර්මවල අනුකරණය, සමාරෝපය සහ අනුරූපණය අන්තර්ගත නොවේ. (......)

- පහත දැක්වෙන කරුණු/ සංකල්ප සුදුසු පරිදි තෝරා 16-19 දක්වා ප්‍රශ්න අංක ඉදිරියේ ඇති හිස්තැන් පුරවන්න. එසේ පිරවීමේ දී එක් පිළිතුරකට අදාළ වරණ 03 ක් ඇති බවත්, එම වරණවලට අදාළ ඉංග්‍රීසි අක්ෂර පිළිතුර සඳහා යෙදිය යුතු බවත් සලකන්න.

| | | |
|---|---|---|
| A - ප්‍රකරණ | E - පංචනාරි ඝට | I - හන |
| B - යුගෙන් | F - ඉචිකව දන්ජුරෝ | J - මහාසම්මත |
| C - නාගරාක්ෂ | G - ත්‍ර්‍යස්‍ර | K - හයෂිබෙය |
| D - ඔකින | H - ඔන්නගත | L - මාලවිකාග්නිමිත්‍ර |

**16.** සංස්කෘත නාට්‍ය හා සම්බන්ධ වන්නේ, (..........)

**17.** නෝ නාට්‍යයට අදාළ වන්නේ, (..........)

**18.** කබුකි නාට්‍යයට අදාළ වන්නේ, (..........)

**19.** කෝළම් නාට්‍යයට අදාළ වන්නේ, (..........)

- අංක 20-25 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා කරුණු/සංකල්ප/නාම 05 බැගින් දී ඇත. ඒ අතුරින් සෙසු පද හා **නොගැළපෙන** එක් පදයක් ඇත. එය තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති වරහනේ ලියන්න.

**20.** (1) කරළිය (2) පිලිප්පු සිඤ්ඤෝ (3) මද්දලය
(4) ඇහැලේපොළ (5) සී. දොන් බස්තියන් (......)

**21.** (1) බලිවාලා (2) පරාභව (3) විශ්වනාත් ලව්ජි
(4) කර්ණාටක සංගීතය (5) ජෝන් ද සිල්වා (......)

**22.** (1) දූව (2) මිරිස්ස (3) වහකෝට්ටේ
(4) පේසාලේ (5) බොරලැස්ස (......)

**23.** (1) කාමන්කුත්තු (2) නවරාත්‍රි (3) දීපාවලී
(4) තෛපොංගල් (5) මහාශිවරාත්‍රි (......)

**24.** (1) වඩමෝඩි (2) රාවනේසන් (3) තෙන්මෝඩි
(4) මහඩි (5) පරෛමේල්ලක්කුත්තු (......)

**25.** (1) කුවේණි (2) හුණුවටයේ කතාව (3) දුන්න දුනුගමුවේ
(4) මකරා (5) දිරිය මව සහ ඇගේ දරුවෝ (......)

Download All Pastpapers from Artsapi.lk

**26.** නූතනයේ ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය ප්‍රවර්ධනයෙහි ලා ක්‍රියා කරන්නෝ වන්නේ,

(1) ඉන්දු ධර්මසේන, හේග් කරුණාරත්න, දීපානි සිල්වා
(2) ජෙරොම් ද සිල්වා, අර්නස්ට් මැකින්ටයර්, රුවන්ති ඩි චිකේරා
(3) ජයන්ත චන්ද්‍රසිරි, පරාක්‍රම නිරිඇල්ල, ජෙරොම් ද සිල්වා
(4) ජෙරොම් ද සිල්වා, ඉන්දු ධර්මසේන, රුවන්ති ඩි චිකේරා
(5) අර්නස්ට් මැකින්ටයර්, ඉන්දු ධර්මසේන, ජෙරොම් ද සිල්වා (......)

**27.** ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් රචනා කොට ඇති සිංහල නාට්‍යකරු වන්නේ,

(1) ධර්මසිරි බණ්ඩාරනායක (2) රංජිත් ධර්මකීර්ති (3) කේ. බී. හේරත්
(4) බන්දුල විතානගේ (5) සුගතපාල ද සිල්වා (......)

**28.** බන්දුල විතානගේ නාට්‍ය නිර්මාණ අන්තර්ගත වරණය තෝරන්න.


(1) බෙකට්, හිරු දහසක්, රෝමය ගිනි ගනී
(2) බෝඩිංකාරයෝ, තුරඟ සන්නිය, රෝමය ගිනි ගනී
(3) බක්මහ අකුණු, බෙකට්, මෝදර මෝල
(4) පුස්ලෝඩං, හිරු දහසක්, වෙස්මුහුණු
(5) මරාසාද්, බෙකට්, රෝමය ගිනි ගනී (......)

**29.** සංස්කෘත නාට්‍යයේ ඉතිවෘත්ත යන්නට අයත් වන්නේ,

(1) බීජ, බින්දු, පතාකා, ප්‍රකරී හා කාර්යය යි.
(2) ආරම්භ, ප්‍රයත්න, ප්‍රාපත්‍යාශා, නියතාප්ති සහ ඵලාගම යි.
(3) මුඛ, විමර්ශ, ගර්භ, අවමර්ශ හා නිර්වහණ යි.
(4) නාට්‍ය වස්තුව, නායකයා හා රස යි.
(5) ප්‍රවේශක, විෂ්කම්භක, අංකමුඛ, අංකාවතාර හා චූලිකා යි. (......)

- පහත දී ඇති වෙස්මුහුණු හඳුනාගෙන 29-33 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. අදාළ අක්ෂරය යොදා හිස්තැන් පුරවන්න.

(ක)


(ග)



(ජ)


(ට)


**30.** සන්නි යකුන් යාගය හා සම්බන්ධ වෙස්මුහුණු වන්නේ, (......)

**31.** කුමදොරි හා සම්බන්ධ වන්නේ, (......)

**32.** නෝ නාට්‍ය සඳහා භාවිතා වන්නේ, (......)

**33.** කෝලම් නාට්‍යයේ වෙස්මුහුණු වන්නේ, (......)

**34.** සංස්කෘත නාටකයෙහි නායක චරිතය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) අභිඥානශාකුන්තලයෙහි දුෂ්‍යන්ත රජ ධීරෝදාත්ත නායකයෙකි.
(2) සංස්කෘත නාට්‍යයෙහි දේව චරිත අයත් වන්නේ ධීරලලිත වර්ගයට ය.
(3) රත්නාවලී නාටිකාවෙහි උදයන රජ ධීර ප්‍රශාන්ත නායකයෙකි.
(4) අභිඥානශාකුන්තලයෙහි දුෂ්‍යන්ත රජ ධීරෝද්ධත නායකයෙකි.
(5) සංස්කෘත නාට්‍යයෙහි නායක චරිත අයත් වන්නේ උත්තම ගණයට පමණි. (......)

Download All Pastpapers from Artsapi.lk

**35.** නාට්‍යශාස්ත්‍රයේ යොදනු ලැබ, පොදුවේ නාට්‍ය කලාවේ භාවිත වේෂභූෂණ යන පාරිභාෂික පදයට අදාළ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) වේෂභූෂණවලට අයත් වන්නේ වෙස්මුහුණු පමණි.
(2) අලංකාර හෙවත් ඇඳුම්-පැළඳුම්, ආභරණ හා මල්දම් වේෂභූෂණ වේ.
(3) අංගරචනා යනු නාට්‍ය කලාවේ වේෂභූෂණ වේ.
(4) කඩු, කස්තාන, ඔටුණු ආදිය වේෂභූෂණ ගණයෙහි ලා නොසැලකේ.
(5) වේෂභූෂණ අවශ්‍ය වන්නේ සංස්කෘත නාට්‍යයට පමණි. (......)

**36.** නාට්‍ය කලාව හා සෙසු ප්‍රාසංගික කලා විෂයයෙහි අදාළ වන හස්තකර්ම පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මේ පිළිබඳ සඳහන් වන්නේ නාට්‍යශාස්ත්‍රයේ 9 වැනි අධ්‍යායේ ය.
(2) මෙය අයත් වන්නේ නාට්‍යශාස්ත්‍රයේ අංගාභිනය සම්බන්ධ විස්තරයට ය.
(3) අංජලී හස්ත යනු අසංයුක්ත හස්තයකි.
(4) අසංයුක්ත හස්ත 24 ක් හා සංයුක්ත හස්ත 13 ක් ගැන නාට්‍යශාස්ත්‍රයේ සඳහන් වේ.
(5) නන්දිකේශ්වරගේ අභිනයදර්පණයෙහි ද මේ ගැන සඳහන් වේ. (......)

**37.** නාට්‍යයක සංගීතය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) නාට්‍යයක සංගීතය අයත් වන්නේ සාත්වික අභිනයට ය.
(2) ගායන, වාදන, හඬ හා ශබ්ද සංකලන සංගීතය ලෙස සැලකේ.
(3) එදිනෙදා භාවිත සංගීත ආකෘති හා නාට්‍ය සංගීතය අතර වෙනසක් නැත.
(4) සංගීතය යොදා නොගෙන වුව ද නාට්‍ය නිෂ්පාදනය කළ හැක.
(5) මිනිස් හඬ පමණක් නාට්‍යයක පසුබිම් සංගීතය ලෙස යොදා ගැනීම අනුචිත ය. (......)

- පහත දැක්වෙන සුප්‍රසිද්ධ කලා නිර්මාණ උපයෝගී කරගෙන 38-40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුරේ අංකය වරහන් තුළ ඇති හිස්තැන තුළ ලියන්න.

(අ) දෝජෝ විහාරය (ආ) කරදිය (ඇ) මානසවිල

**38.** 'අ' අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) කබුකි නාට්‍යයකි. (2) බුගකු නාට්‍යයකි. (3) නෝ නාට්‍යයකි.
(4) ජපන් චිත්‍රපටයකි. (5) බුන්රකු නාට්‍යයකි. (......)

**39.** 'ආ' අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) ගීත නාටකයකි. (2) මුද්‍රා නාට්‍යයකි. (3) ගීත නාට්‍යයකි.
(4) ඔපෙරාවකි. (5) වේදිකා නාට්‍යයකි. (......)

**40.** 'ඇ' අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) ඉන්දියානු නෘත්‍ය නාටකයකි. (2) චිත්‍රපටයකි. (3) ගීත නාටකයකි.
(4) ඔපෙරාවකි. (5) බැලේ නාටකයකි. (......)

★★

Artsapi.lk
Download All Pastpapers from Artsapi.lk

## II කොටස

**සැලකිය යුතුයි:**

★ එක් කොටසකින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## A කොටස

**1.** (i) අභිඥානශාකුන්තලයට පසුබිම් වූ පුරාවෘත්තය හඳුන්වන්න.
(ii) කාලිදාස ඉහත (i) හි සඳහන් පුරාවෘත්තයට සිදුකොට ඇති වෙනස්කම් පහක් සඳහන් කරන්න.
(iii) අභිඥානශාකුන්තලයේ සිව්වැනි අංකයේ එන හොඳ ම පද්‍ය තුනක් තෝරා, එසේ තෝරා ගැනීමට හේතු දක්වන්න. (පද්‍ය සම්පූර්ණයෙන් ලියා දැක්වීම අවශ්‍ය නො වේ) (ලකුණු 15)

**2.** (i) නෝ නාට්‍ය දෙකක් නම් කරන්න.
(ii) ඔබ නම් කළ නාට්‍ය දෙක ඇසුරින් නෝ නාට්‍යයෙන් ප්‍රකට වන ජීවන දර්ශනය පැහැදිලි කරන්න.
(iii) ඉහත නාට්‍ය දෙකෙන් එකක් ආශ්‍රය කොටගෙන නෝ නාට්‍ය කලාවට පසුබිම් වන දර්ශනය නෝ රංග ශෛලියෙන් ප්‍රකට වන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 15)

**3.** (i) මූලාශ්‍රයන්හි දැක්වෙන කුවේණිය හා නාට්‍ය රචකයා දුටු කුවේණිය අතර ඔබ දකින වෙනස්කම් හතරක් දක්වන්න.
(ii) ඉන් වෙනස්කම් දෙකක් පිළිබඳ නිදසුන් සහිත සාකච්ඡාවක් කරන්න.
(iii) නාට්‍යකරු කුවේණිය ගේ චරිත ලක්ෂණ ප්‍රකට වන ලෙස සංවාද භාවිත කොට ඇති අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 15)

## B කොටස

**4.** (i) කබුකි වේදිකාවේ රූප සටහනක් ඇඳ එහි කොටස් නම් කරන්න.
(ii) කබුකි වේදිකාවේ ශක්‍යතාව නෝ වේදිකාවේ ශක්‍යතාව හා සසඳන්න.
(iii) වේදිකාවේ භෞතික සැලැස්ම කබුකි රංග ශෛලිය කෙරෙහි කෙසේ උපයෝගි වන්නේ දැයි විමර්ශනයක් කරන්න. (ලකුණු 15)

**5.** (i) නාඩගම් රංග ශෛලියේ විශේෂ ලක්ෂණ හතරක් සඳහන් කරන්න.
(ii) නූර්ති නාට්‍ය නාඩගමට වඩා ජනප්‍රිය වීමට හේතු වූ කරුණු දෙකක් පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.
(iii) නූර්ති අභාවයට යාමත් සමග කරළියට ආ නාට්‍ය ප්‍රභේද දෙකක් හඳුන්වා ඒ පිළිබඳ සාකච්ඡාවක් කරන්න. (ලකුණු 15)

**6.** (i) මනමේ නාට්‍යයේ මුල් ම දර්ශනයේ රඟ පෑ නළුවා හා නිළිය නම් කරන්න.
(ii) මනමේ නාට්‍යය සිංහල වේදිකා නාට්‍ය කලාවේ සන්ධිස්ථානයක් ලෙස සැලකීමට තුඩු දුන් කරුණු දෙකක් පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.
(iii) මනමේ නාට්‍ය බිහිවීමෙන් අනතුරුව සිංහල වේදිකා නාට්‍ය කලාවේ හටගත් නව ප්‍රවණතාවන්ට මූලික වූ නාට්‍යකරුවන් දෙදෙනෙකු හා ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 15)

★★★

Artsapi.lk
Download All Pastpapers from Artsapi.lk

# (57) නාට්‍ය හා රංග කලාව (සිංහල)

**II පත්‍රය**

**සැලකිය යුතුයි:**

- ★ **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතුය.**
- ★ **නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

---

### I කොටස


**1.** ක්‍රි. පූ 534 දී ප්‍රථම වරට ඩිතුරම්බොස් ගායන වෘන්දයට එක් වූ නළුවා වන්නේ,
(1) පෙරියන්ඩර් ය. (2) අරියොන් ය. (3) තෙස්පිස් ය.
(4) සොලොන් ය. (5) මෙනන්ඩ්‍රොස් ය. (......)

**2.** ආරම්භයේදී දොළොස් දෙනෙකු ගෙන් සමන්විත වූ ගායන වෘන්දය පසළොස දක්වා වැඩි කළේ,
(1) ඊස්කිලස් ය. (2) සොෆොක්ලීස් ය. (3) යුරිපිඩීස් ය.
(4) අරිස්ටොෆනීස් ය. (5) මෙනන්ඩ්‍රොස් ය. (......)

**3.** ඇරිස්ටෝටල් ගේ කාව්‍යශාස්ත්‍රයේ සඳහන් පරිච්ඡේද ගණන,
(1) දහ අටකි. (2) විසි දෙකකි. (3) විසි හතරකි.
(4) විසි හයකි. (5) විසි අටකි. (......)

**4.** සටුර නාට්‍ය අතුරින් දැනට සම්පූර්ණයෙන් ම ඉතිරි වී ඇති එක ම නාට්‍යය,
(1) කුක්ලොප්ස් ය. (2) ඉක්නෙව්ටායි ය. (3) අබර්ණියයෝ ය.
(4) බක්ඛයි ය. (5) දෙබරු ය. (......)

- පහත දැක්වෙන රූපසටහන ආශ්‍රයෙන් 5 හා 6 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න



Parts of a Greek Theater

**5.** ඉහත රූප සටහනේ A අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක්ද?
(1) පැරසීනියම් (2) ප්‍රේක්ෂාලය (3) ඕර්කිස්ට්‍රා
(4) ප්‍රොස්කිනොන් (5) පැරඩොයි (......)

**6.** ඉහත රූප සටහනේ B අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක්ද?
(1) ප්‍රේක්ෂාලය (2) අල්තාරය (3) වේදිකාව
(4) පැරඩොයි (5) මකීනා (......)

**7.** ඊඩිපස් නාට්‍යයේ වේදිකාව මත රඟ දක්වා පෙන්වන අවස්ථාවක් විය හැක්කේ,
(1) ඊඩිපස් කලකිරී නෙත් අඳ කරගැනීම ය.
(2) ඊඩිපස් තුන් මං හන්දියට පැමිණීම ය.
(3) ස්ෆින්ක්ස් ප්‍රහේළිකා විමසීම ය.
(4) යොකැස්ටා ඊඩිපස් වෙතින් ශෝකීව නික්මයාම ය.
(5) ඊඩිපස් අතින් ක්ෂණික කෝපයෙන් ලයියුස් ඝාතනය වීම ය. (......)

Artsapi.lk
Download All Pastpapers from Artsapi.lk

8. පශ්චාද්දෘෂ්ටිකථනය මගින් සොෆොක්ලීස් අපේක්ෂා කළ අරමුණ වූයේ,
(1) සිදුවීම් අනුපිළිවෙළින් ඉදිරිපත් කිරීමයි. (2) ප්‍රේක්ෂක කුතුහලය රඳවා ගැනීමයි.
(3) සෑම සිදුවීමක් ම වේදිකාව මතට ගෙන ඒමයි. (4) නළුවන් සංඛ්‍යාව සීමා කිරීමයි.
(5) ගායන වෘන්දයේ කාර්යභාරය පහසු කිරීමයි. (......)

9. මුල් ම මධ්‍යකාලීන ජන වන්දනා නාට්‍යය ලෙස සැලකෙන්නේ,
(1) පළමු එඬේරාගේ කතාව ය. (2) නොආගේ කතාව ය.
(3) දෙවන එඬේරාගේ කතාව ය. (4) මරියාවරුන් තිදෙනාගේ කතාව ය.
(5) සකලජන ය. (......)

10. කිතුනු සාන්තුවරයන්ගේ ජීවිත අළලා නිර්මාණය කළ නාට්‍ය වන්නේ කුමක්ද?
(1) මිස්ටරි (2) මොරැලිටි (3) මිරකල්
(4) පාස්කු (5) පසන් (......)

11. මධ්‍යකාලීන යුරෝපයේ චක්‍ර නාටකයට අදාළ **නොවන** අංගය වන්නේ,
(1) රථ වේදිකා ය. (2) සාන්තුවර කතා පුවත් ය. (3) පූජක නළුවෝ ය.
(4) යන්ත්‍ර සූත්‍ර භාවිතය ය. (5) බහු වේදිකා ය. (......)

12. ආචාර්ය ෆවුස්ටස් හා මෝල්ටාවේ යුදෙව්වා යන නාට්‍ය නිර්මාණය කළේ කවුද?
(1) තෝමස් කිඩ් (2) ජෝන් ලයිලි (3) ක්‍රිස්ටෝෆර් මාලෝ
(4) රොබර්ට් ග්‍රීන් (5) විලියම් ශේක්ස්පියර් (......)

13. පහත දැක්වෙන නාට්‍ය අතුරින් ට්‍රැජඩි හෙවත් ශෝකජනක නාටකය කුමක්ද?
(1) ද ටෙම්පස්ට් හෙවත් කුණාටුව
(2) කිං ලියර් හෙවත් ලියර් රජ
(3) මිඩ් සමර් නයිට්ස් ඩ්‍රීම් හෙවත් ගිම්හානේ මැදියම් රැයක සිහිනයක්
(4) මර්චන්ට් ඔෆ් වැනිස් හෙවත් වැනිසියේ වෙළෙන්දා
(5) කොමඩි ඔෆ් එරර්ස් හෙවත් වැරදීමේ ප්‍රහසනය (......)

14. ඉතාලි කතාකරු ගිරාල්ඩෝ සින්තියාගෝගේ 'හෙකටොම්ති' නම් නාට්‍ය එකතුවෙන් සපයා ගත් කතාවක් ආශ්‍රයෙන් රචනා කළ නාට්‍යය කුමක්ද?
(1) වැනිසියේ වෙළෙන්දා (2) හැම්ලට් (3) ඔතෙලෝ
(4) ලියර් රජ (5) මැක්බත් (......)

15. ජූලියස් සීසර් නාට්‍යයට පාදක මූලාශ්‍රය වන්නේ,
(1) ප්ලූටාක්ගේ 'ග්‍රීක රෝම වංශවතුන්ගේ ජීවිත' නම් කෘතියයි.
(2) එංගලන්තයෙ, අයර්ලන්තයේ සහ ස්කොට්ලන්තයේ වංශකථායි.
(3) වර්ජිල්ගේ ඊනිඩ් කෘතියයි.
(4) හෝමර්ගේ ඔඩිසි කාව්‍යයයි.
(5) ප්ලේටෝගේ සිම්පෝසියම් සංවාදයයි. (......)

16. ජූලියස් සීසර් නාට්‍ය තුළ සීසර් ජීවමාන ව පෙනී සිටින්නේ,
(1) එක් ජවනිකාවක පමණි. (2) ජවනිකා දෙකක පමණි. (3) ජවනිකා තුනක පමණ.
(4) ජවනිකා හතරක පමණි. (5) ජවනිකා පහක පමණි. (......)

17. ''සීසර් මැරුවට පස්සේ ඇන්ටනි මැරුණු සීසර්ගෙ අප්‍රාණික අත වගේ වේවි'' යන ප්‍රකාශය කළේ කවරෙක් ද?
(1) කැසියස් (2) බ්‍රූටස් (3) සින්නා (4) ඩෙසියස් (5) කස්කා (......)

18. ''සීසර්ගේ ශරීරයේ හදපු තුවාල තිස්තුනේ පළිය ගන්නාතුරු මා මේ ඇදගත් කඩුව කොපුවට දාන්නේ නෑ'' මෙසේ පවසන්නේ කවුරුන් ද?
(1) මාක් ඇන්ටනි (2) ලෙපිඩස් (3) ඔක්ටේවියස් (4) පබ්ලියස් (5) සිසරෝ (......)

Download All Pastpapers from Artsapi.lk

**19.** රංග රීතිය හා සම්බන්ධ වන පදය තෝරන්න.
(1) නත්තල් ගස. (2) පශ්චාද්දෘෂ්ටි කථනය.
(3) පොරොන්දු පත්‍රය. (4) රූකඩ ගෙදර යන නාමය.
(5) ව්‍යාජ අත්සන. (......)

**20.** ''ජීවත් වෙන්නට ශෝකයක් දුකක් තරම්වත් ඉතුරු කළේ නෑ'' රූකඩ ගෙදර නාට්‍යයේ එම ප්‍රකාශය කරන්නේ කවුරුන් කාහට ද?
(1) නෝරා විසින් හෙල්මට (2) හෙල්ම විසින් රන්ක්ට
(3) රන්ක් විසින් ක්‍රොග්ස්ටඩ්ට (4) ලින්ඩ මහත්මිය විසින් නෝරාට
(5) ක්‍රොග්ස්ටඩ් විසින් ලින්ඩ මහත්මියට (......)

**21.** 'රූකඩ ගෙදර' නාට්‍යයේ නෝරාගේ මනෝභාවයන් මතුකිරීම පිණිස උදව් කරගත් නාට්‍යෝපකරණය කුමක් ද?
(1) නත්තල් ගස (2) ගෘහභාණ්ඩ (3) කැටයම් චිත්‍රය
(4) පියානෝව (5) ලියුම් පෙට්ටිය (......)

**22.** රූකඩ ගෙදර නාට්‍යයේ ක්‍රොග්ස්ටඩ් නෝරාගෙන් කරන ඉල්ලීම වන්නේ,
(1) ක්‍රිස්ටීන් රැකියාවට නොගන්නා ලෙසයි.
(2) තමා රැකියාවෙන් ඉවත් නොකරන්නැ යි හෙල්මට බල කරන ලෙසයි.
(3) සෙල්ලම් බාලට නොයන ලෙසයි.
(4) තමා පැමිණි බව හෙල්මට නොකියන ලෙසයි.
(5) ණය මුදල ගැන ක්‍රිස්ටීන් ට පවසන ලෙසයි. (......)

**23.** හෙන්රික් ඉබ්සන් රචනා කළ නාට්‍ය පමණක් අන්තර්ගත ගොනුව තෝරන්න.
(1) මිස් ජුලී, කතුවරයෙක් සොයන චරිත හයක්, සමාජයේ කුලුණු
(2) ගොඩෝ එනකං, හිරු දහසක්, අවතාර
(3) වන තාරාවා, තරුණ සංගමය, ජන හතුරා
(4) රොස්මෂෝම්, ආම්ස් ඇන්ඩ් ද මෑන්, චෙරිවත්ත
(5) අප මළවුන්ගෙන් නැගිටි කල්හ, මකරා, ගැලිලියෝ (......)

**24.** සැමුවෙල් බෙකට්, ඉයුජින් අයනෙස්කෝ, හැරල්ඩ් පින්ටර් යන නාට්‍යකරුවන් අයත් වන්නේ,
(1) විසංගත නාට්‍යකරුවන් ගණයට ය. (2) රොමැන්ටික් නාට්‍යකරුවන් ගණයට ය.
(3) එපික් නාට්‍යකරුවන්ට ය. (4) යථාර්ථවාදී නාට්‍යකරුවන්ට ය.
(5) සංකේතවාදී නාට්‍යකරුවන්ට ය. (......)

**25.** පහත සඳහන් නාට්‍යකරුවන් අතරින් ප්‍රකට ප්‍රකාශනවාදී නාට්‍යකරුවා කවුද?
(1) අර්වින් පිස්කැටර් (2) ඕගස්ට් ස්ට්‍රින්ග්න්බර්ග් (3) ඉයුජින් අයනෙස්කෝ
(4) ඇලෙක්සැන්ඩර් ඩූමා (5) ආතර් ඇඩමොෆ් (......)

**26.** බටහිර නූතන ප්‍රකාශනවාදී නාට්‍යයක් වන්නේ කුමක් ද?
(1) ජන සතුරා (2) දිරිය මව සහ ඇගේ දරුවෝ (3) ආශාවේ වීදි රිය
(4) යෙර්මා (5) මුහුදු ලිහිණියා (......)

**27.** පහත (i), (ii), (iii) යටතේ සංවාද කිහිපයක් ද, A,B සහ C ලෙස නාට්‍ය කිහිපයක නම් ද දක්වා ඇත.
(i). ''වැඩි බරපතල අමාරුවක් නෙවෙයි? එතකොට ටිකක් විනෝද වෙන්න අපේ නගරෙට එන්න ඇති''
(ii) ''මා විකාරයක් විදියට නුඹට පේනවා විය හැකියි එහෙත් නුඹගේ මා පියන් එසේ නොසිතනු ඇත''
(iii) ''ඔබ ඔබේ දර්ශනයෙන් කිසි ප්‍රයෝජනයක් ගන්නෙ නැතේ, අහම්බෙන් පතිත වන වාසනාව ගැන ඉන් කියවෙනවනේ''

A. ජුලියස් සීසර් B. රූකඩ ගෙදර C. ඊඩිපස්

ඉහත (i), (ii), (iii) සංවාද අන්තර්ගත නාට්‍ය අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(1) ABC (2) ACB (3) BAC (4) BCA (5) CBA (......)

Download All Pastpapers from Artsapi.lk

**28.** ළමා නාට්‍ය කලාවට අදාළ පහත සඳහන් වරණවලින් **නිවැරදි** වරණය තෝරන්න.

(1) ළමා නාට්‍යයට ඊට විශේෂ වූ ගති ලක්ෂණ අවශ්‍ය නැත.
(2) වයස් කාණ්ඩවලට ආවේණික චර්යා රටා ළමා නාට්‍ය සඳහා වැදගත් නොවේ.
(3) ළමා නාට්‍ය නිර්මාණයේ දී ඔවුන්ගේ හැකියා, සිතුම් පැතුම්, චර්යා අධ්‍යයනය කළ යුතු වේ.
(4) ශ්‍රී ලංකාවේ ළමා නාට්‍ය සඳහා රාජ්‍ය මට්ටමේ සම්මාන උළෙලක් නොපැවැත්වේ.
(5) ළමා නාට්‍යයක් සතුටුදායක අවසානයකින් යුක්ත විය යුතු නැත. (......)

**29.** නාට්‍ය විචාරයට අදාළ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) නාට්‍ය විචාරය පිළිබඳ පැරණිම ග්‍රන්ථය රචනා වූයේ ශෝකජනක නාට්‍යයවලට අදාළව ය.
(2) නාට්‍ය විචාරය පිළිබඳ පිළිගත් සිද්ධාන්ත කිසිවක් නැත.
(3) නාට්‍ය විචාරකයා හොඳ රසිකයෙක් හා ප්‍රේක්ෂකයෙක් විය නොහැක.
(4) නාට්‍ය විචාරය අපරදිගට පමණක් සීමා වූ මතවාදයකි.
(5) නාට්‍ය කලාවේ අභිවෘද්ධිය උදෙසා විචාර කලාවක් අත්‍යවශ්‍ය ය. (......)

**30.** නාට්‍ය කලාවේ භූමිකා යන පරිභාෂික පදයට අදාළ **වැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) රූකඩ ගෙදර නාට්‍යයේ 'බිරිඳ'ක ලෙස නෝරාගේ භූමිකාව 'මිතුරිය' ක ලෙස වන ඇගේ භූමිකාව හා ගැටෙයි.
(2) ජූලියස් සීසර් නාට්‍යයේ බ්‍රූටස්ගේ භූමිකාව ඔහුගේ චරිත ලක්ෂණ හා ගැටෙයි.
(3) නාට්‍යයක එක් චරිතයකට භූමිකා කිහිපයක් රඟපෑමට සිදු වේ.
(4) භූමිකා ගැටුමෙන් නාට්‍ය අර්ථවත් වේ.
(5) 'කුවේණි' නාට්‍යයේ කථකයාට භූමිකාවක් නැත. (......)

**31.** නාට්‍යයක රූපණයට අදාළ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) කොන්ස්ටාන්ටින් ස්ටැනිස්ලාවුස්කි රූපණ සිද්ධාන්තයක් හඳුන්වා දුණි.
(2) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් රූපණය කෙරෙහි විශේෂ අවධානයක් නොදැක්වී ය.
(3) රූපණය සඳහා නාට්‍යයක චරිත ගැඹුරින් අධ්‍යයනය කළ යුතු නැත.
(4) මෙයර්හෝල්ඩ්ගේ 'ජීව යාන්ත්‍රණය' රූපණ වේදයක් ලෙස කිසිවෙක් අත්හදා බැලුවේ නැත.
(5) රූපණය සිදුකළ යුත්තේ අධ්‍යක්ෂවරයාට අවශ්‍ය ලෙසින් පමණි. (......)

**32.** අනුකරණය යන්නට අදාළ පහත සඳහන් ප්‍රකාශ අතුරින් **වැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) ග්‍රීක භාෂාවෙහි අනුකරණය 'මිමෙසිස්' ලෙස හැඳින්වේ.
(2) ග්‍රීක ශෝකජනක නාට්‍යයකින් අනුකරණය කරනුයේ පුද්ගල චරිතය.
(3) පෙරදිග නාට්‍ය කලාවේ ද අනුකරණය පිළිබඳ සඳහන් වේ.
(4) ඇරිස්ටෝටල් අනුකරණය පැහැදිලි ව විග්‍රහ කොට ඇත.
(5) අනුකරණය මිනිස් ස්වභාවයේ මූලික ලක්ෂණයකි. (......)

**33.** වේදිකා නාට්‍යයක ආනුෂංගික අංග පිළිබඳ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) ආනුෂංගික අංග නාට්‍යයක ප්‍රේක්ෂාවට බලපෑමක් නැත.
(2) රංගාලෝකය මීට අයත් නොවේ.
(3) ආනුෂංගික අංග උපරිම වශයෙන් යෙදීමෙන් නාට්‍යයක් සාර්ථක වේ.
(4) පෙරදිග සංකල්පය අනුව ආහාර්ය අභිනයට අයත් වේ.
(5) අධ්‍යක්ෂවරයාගේ මැදිහත් වීම අවශ්‍ය නොවේ. (......)

**34.** වේදිකා පසුතල සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරින් **වැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) කුවේණි නාට්‍යයේ පසුතල භාවිතා කරයි.
(2) නාට්‍යධර්මී ශෛලියේ දී පසුතල අවශ්‍ය නොවේ.
(3) ශේක්ස්පියරියානු නාට්‍යවල පසුතලය පිළිබඳ හැඟීමක් දීම සංවාද වලින් ඉටු වේ.
(4) රූකඩ ගෙදර නාට්‍යයේ කිසිදු පසුතලයක් නැත.
(5) ත්‍රිමාන පසුතල භාවිතයට ආවේ තත්ත්වානුරූපී මායාව නිරූපණයට ය. (......)

Artsapi.lk

Download All Pastpapers from Artsapi.lk

**35.** නාට්‍ය සංගීතය පිළිබඳ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) සංගීතය නොමැති වේදිකා නාට්‍යයක් නැත.
(2) සංගීතය ආහාර්ය අභිනයට පමණක් අයත් වේ.
(3) කුවේණි නාට්‍යය ශෝකී ස්වභාවයකින් යුතු හෙයින් සංගීතය භාවිත කිරීම උචිත නැත.
(4) ආනුෂංගික අංගයක් ලෙස නොසැලකේ.
(5) ඇරිස්ටෝටල් ශෝකජනක නාට්‍යයේ සංගීතයට ප්‍රමුඛත්වයක් දී නැත. (......)

- පහත දී ඇති වගුව ආශ්‍රයෙන් 36-40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - පූරක | F - මෙරේපේ | K- මුවා |
| B - තරන්තලා | G - ස්වෝන් | L- මැකරූන් |
| C - හෝසන්නා | H - සුගති උයන | M- මග්දලේනා |
| D- ඩෙල්ෆි | I - තීබය | N- විනිශ්චයකරු |
| E - ග්ලෝබ් | J - පෝටර් | O- රෝස් |

**36.** මධ්‍යකාලීන ජන වන්දනා නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) AIE (2) BIO (3) CHM (4) DIO (5) LNO (......)

**37.** රූකඩ ගෙදර නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) BHN (2) BJL (3) BJN (4) DJO (5) EFO (......)

38. ග්‍රීක නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) DFI (2) DJL (3) EGN (4) EIJ (5) EKM (......)

**39.** කුවේණි නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) AMN (2) AKN (3) BJN (4) DKO (5) LPR (......)

**40.** එළිසබෙතීන වේදිකාව හා සම්බන්ධ වන්නේ,
(1) EGO (2) FGN (3) FHO (4) KLN (5) MNO (......)

★★

Artsapi.lk

Download All Pastpapers from Artsapi.lk

## II කොටස

**සැලකිය යුතුයි:**

★ එක් කොටසකින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

---

### A කොටස

1. (i) ඇරිස්ටෝටල් කාව්‍යශාස්ත්‍රයේ දක්වා ඇති පරිදි ඛේදනීය වීරයා සතු විය යුතු ගුණාංග **හතරක්** සඳහන් කරන්න.
   (ii) ඊඩිපස් නාට්‍යයෙහි ඛේදනීය වීර චරිතය ආශ්‍රයෙන් එකී ගුණාංග **දෙකක්** පිළිබඳ විවරණයක් කරන්න.
   (iii) ඊඩිපස් රජුගේ චරිතයෙහි ප්‍රබල හා දුබල ලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 15)

2. (i) ග්‍රීක කොමඩි නාට්‍ය රචක ඇරිස්ටොෆානිස්ගේ නාට්‍ය **හතරක්** නම් කරන්න.
   (ii) ඔහුගේ නාට්‍යයට ආවේණික ලක්ෂණ **දෙකක්** සඳහන්කර විස්තර කරන්න.
   (iii) ග්‍රීක කොමඩි නාටකය පිළිබඳ විමර්ශනයක් කරන්න. (ලකුණු 15)

3. (i) එළිසබෙතීන යුගයට අයත් වේදිකාවේ රංග අවකාශ **හතරක්** නම් කරන්න.
   (ii) ඉහත (i) නම් කරන ලද රංග අවකාශ **දෙකක්** පිළිබඳ විස්තරයක් කරන්න.
   (iii) ශේක්ස්පියර්ගේ නාට්‍යයක් නිදසුන් වශයෙන් ගෙන එළිසබෙතීන වේදිකාවේ කෙසේ රංගගත කරන්නට ඇද්දැ යි සාකච්ඡා කරන්න. (ලකුණු 15)

### B කොටස

4. (i) ජුලියස් සීසර් නාට්‍යයේ සීසර්ගේ අවමඟුලේ දේශන පැවැත් වූ චරිත නම් කරන්න.
   (ii) එම අවමඟුල් දේශන දෙකෙහි අන්තර්ගතය සැකෙවින් දක්වන්න.
   (iii) අවමඟුල් දේශනවලට සවන් දුන් මහජනයාගේ ප්‍රතිචාර පැහැදිලි කරමින් ඒ පිළිබඳ විමර්ශනයක් කරන්න. (ලකුණු 15)

5. (i) යථාර්ථවාදී නාට්‍ය කලාවේ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.
   (ii) ඉහත (i) හි සඳහන් කළ ලක්ෂණ **දෙකක්** පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.
   (iii) රෑකඩ ගෙදර හැර වෙනත් යථාර්ථවාදී නාට්‍යයක් ගැන සාකච්ඡාවක් කරන්න. (ලකුණු 15)

6. (i) රෑකඩ ගෙදර නාට්‍යයේ නෝරා සහ හෙල්ම 'ජීවිතය' පිළිබඳ දරණ ආකල්ප දෙක බැගින් සඳහන් කරන්න.
   (ii) ඉහත (i) හි සඳහන් ආකල්ප එකිනෙකට පටහැනි වන ආකාරය නිදසුන් මගින් පෙන්වා දෙන්න.
   (iii) ඉහත (ii) හි සඳහන් කළ පටහැනි බව ගැටුමක් දක්වා නාට්‍යෝචිත ව වර්ධනය වන ආකාරය පහදන්න. (ලකුණු 15)

★★★

Artsapi.lk

Download All Pastpapers from Artsapi.lk

## ප්‍රායෝගික පරීක්ෂණය හැඳින්වීම

2019 වර්ෂයේ පටන් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට නියමිත අ.පො.ස. උ/පෙළ විභාගයේ නාට්‍ය හා රංග කලාව ප්‍රායෝගික පරීක්ෂණය පිළිබඳ මූලික තොරතුරු පහත පරිදි වේ.

මෙම පරීක්ෂණය ඇගයීම් හයකින් සමන්විත වේ. ඒවා මෙසේ ය.

- රූපණය සඳහා අනිවාර්ය ඇගැයීම් 3 කි. (A කොටස)
- රූපණය සඳහා ඇගැයීම් තුනක් අතරින් තෝරා ගත් එක් ඇගැයීමක්. (B කොටස)
- නාට්‍ය නිෂ්පාදනය ආශ්‍රිතව ඇගැයීම් තුනක් ඇසුරින් තෝරාගත් එක් ඇගැයීමක්. (C කොටස)
- ඉහත රූපණය හා නිෂ්පාදනය ආශ්‍රිත තෝරාගත් ඇගැයීම් දෙක ආශ්‍රිත වාචා පරීක්ෂණය. (D කොටස)

ඒ පිළිබඳ සවිස්තර සටහනක් පහතින් දැක්වේ.

| | ඇගැයීම | අනිවාර්ය/තේරීම් | කාලය වි. | උපරිම නිර්ණායක සංඛ්‍යාව | ලකුණු |
|---|---|---|---|---|---|
| A | පෙළ ආශ්‍රිත භාෂණ රංගනය (කොටස් දෙකකි) | අනිවාර්ය | (03+03)=06 | 04 | 30 |
| | එසැණ නිරූපණය | අනිවාර්ය | 03 | 03 | 15 |
| | කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම | අනිවාර්ය | 05 | 03 | 15 |
| B | සංගීත ඛණ්ඩයකට අනුව ඉදිරිපත් කරන නිර්මාණාත්මක රංගනය | තේරීම් | 04 | 03 | 15 |
| | නාට්‍ය ගීතයක් ගායනයෙන් හා රංගනයෙන් ඉදිරිපත් කිරීම | තේරීම් | 03 | 03 | 15 |
| | ගැමි නාටක / ශාන්තිකර්ම ආශ්‍රිත චරිත නිරූපණය | තේරීම් | 05 | 03 | 15 |
| C | අංග රචන නිර්මාණ සැලසුම | තේරීම් | 60 | 03 | 15 |
| | වේෂ භූෂණ නිර්මාණ සැලසුම | තේරීම් | 60 | 03 | 15 |
| | පසුතල නිර්මාණ සැලසුම | තේරීම් | 60 | 03 | 15 |
| D | වාචා පරීක්ෂණය | අනිවාර්ය | 05 | | 10 |

- ඉහත ඇගයීම් අතුරින් ඇතැම් ඇගැයීම් මෙතෙක් පැවැති ප්‍රායෝගික පරීක්ෂණයේ ක්‍රියාකාරකම් ම වෙනත් ස්වරූපයකින් යළි ඉදිරිපත් කිරීමක් වන අතර සෙසු ඇගැයීම් අලුතෙන් හඳුන්වා දෙනු ලබන ඒවා වේ.

- මෙම ඇගයීම් සඳහා භාවිතා කරන සෑම නිර්ණායකයකට ම, ලකුණු 0ක අවම සාධන මට්ටමක සිට ලකුණු 5ක් ප්‍රදානය කෙරෙන උපරිම සාධන මට්ටමක් දක්වා වන ලකුණු පරිමාණයක් අනුව ලකුණු ප්‍රදානය කෙරේ.

- මෙම අපේක්ෂිත සාධන මට්ටම්, ප්‍රයෝගික පරීක්ෂණයේ දී අයදුම්කරුවන් ඇගැයීමට පමණක් නොව. පංති කාමර මට්ටමේ දී අයදුම්කරුවන් පුහුණු කිරීම සඳහා ද ගුරු භවතුන්ට ප්‍රමිතියක් මෙන්ම අයදුම්කරුවන්ට ස්වයං අධ්‍යයනය සඳහා ද මගපෙන්වීමක් වනු ඇත.

- යම් නිර්ණායකයකට අදාළව ලකුණු ප්‍රදානයේ දී, උපරිම සාධන මට්ටමේ සිට අවම සාධන මට්ටම දක්වා වන පොදු ප්‍රමිතීන් පහත දැක් වේ.

Download All Pastpapers from Artsapi.lk

| ලකුණ | ප්‍රමිතිය | විස්තරය |
|---|---|---|
| 5 | **විශිෂ්ටයි** | ගුණාත්මක බවින් හා ශිල්පීය මට්ටමින් ඉතා විශිෂ්ට මට්ටමේ ඉදිරිපත් කිරීමකි. |
| 4 | **ඉතා හොඳයි** | ගුණාත්මක බවින් ඉහළ ඉදිරිපත් කිරීමකි. අවශ්‍ය වන්නේ යම් යම් සංවර්ධනයන් කිහිපයක් පමණි. |
| 3 | **හොඳයි** | මූලික ශිල්පීය අවශ්‍යතාවන් හා ප්‍රමිතීන් සපුරා ඇත. තව දුරටත් සංවර්ධනය කළ හැකි ශිල්පීය හා නිර්මාණාත්මක විභවයන් විශද කරවයි. |
| 2 | **වැඩි දියුණු කළ යුතුයි** | අපේක්ෂිත ප්‍රමිතියට ළඟා වී නැත. පුහුණුව අවශ්‍ය යි. සූදානම ප්‍රමාණවත් නැත. මූලික මට්ටමේ ඉදිරිපත් කිරීමක් පමණි.ගුණාත්මකව පෝෂණය වී නැත. |
| 1 | **දුර්වලයි** | දරුවාගේ සූදානම මඳ ය. ඇගයීම පිළිබඳ අවබෝධයක් නැත. විටෙක ඇගයීම් මණ්ඩලයේ ද සහායෙන් යම් ඉදිරිපත් කිරීම් සිදු කරයි. |
| 0 | **ඉතා දුර්වලයි** | කිසිදු ඉදිරිපත් කිරීමක් සිදු නොකරයි. ඇගයීමට කිසිදු සූදානමක් නැත. ඉදිරිපත් කිරීමක් කළ ද එය ඉතා දුර්වල ය. ඇගයීමට අදාළ නොවන්නකි. |

Artsapi.lk

Download All Pastpapers from Artsapi.lk

## (57) නාට්‍ය හා රංග කලාව (සිංහල) (ප්‍රායෝගික පරීක්ෂණය)

A කොටස - රූපණය / රඟපෑම (acting)    ලකුණු - 60

| | | | |
|---|---|---|---|
| A1 ඇගැයීම | පෙළ ආශ්‍රිත භාෂණය - (අනිවාර්ය)<br>**විෂය නිර්දේශගත නාට්‍ය පෙළවලින් මෙම ඇගැයීම සඳහා භාවිතා කිරීමට යෝග්‍ය කොටස් සහ මෙම ප්‍රායෝගික ඇගැයීම වෙනුවෙන් ලබා දී ඇති පෙළ කොටස් අතරින් අපේක්ෂයා තෝරාගෙන පුහුණු වී පැමිණි කොටසක් රංගනයෙන් ද ඇගැයීම් මණ්ඩලය විසින් ලබා දෙන පෙළ කොටසක් පාඨනයෙන් ද ඉදිරිපත් කළ යුතු ය.** | | |
| | A1- 1 ප්‍රායෝගික පරීක්ෂණය සඳහා නිර්දේශිත පෙළ කොටස් ඇසුරින් විභාග අපේක්ෂකයා විසින් තම අභිමතය පරිදි පුහුණු වී පැමිණි ඒකල භාෂණය රඟ දැක්වීම. **(කාලය විනාඩි 02-03) (ලකුණු 20)**<br><br>A1- 2 පරීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන පෙළ කොටසක් උසුරුවීම (recitation) **(කාලය විනාඩි 02-03) (ලකුණු 10)** | **ලකුණු 30** | **ඇගැයීමේ නිර්ණායක**<br>A1- 1 ඇගැයීම<br>1. කටහඬ නිපුණතාව<br>2. පෙළ ස්මරණය<br>3. චරිත නිරූපණය<br>4. ප්‍රේක්ෂක සහසම්බන්ධය<br>A1- 2 ඇගැයීම<br>1. කටහඬ නිපුණතාව<br>2. භාවාත්මක නිරූපණය |
| A2 ඇගැයීම | එසැණ නිරූපණය - (අනිවාර්ය)<br>**තෝරාගන්නා සිදුවීමක් ඇසුරින් නාට්‍යමය අවස්ථාවක් විනාඩි 02ත් 04ත් අතර කාලයක් තුළ එසැණින් නිරූපණය කර පෙන්වීම.** | | |
| | අපේක්ෂකයා විසින් තෝරා ගනු ලබන මාතෘකාවක් ඇසුරින් එසැණ නිරූපණයක් ඉදිරිපත් කිරීම.<br>අපේක්ෂකයා විසින් නිරූපණය කළ යුත්තේ එක් චරිතයක් පමණි.<br>**(කාලය විනාඩි 02-03)** | **ලකුණු 15** | **ඇගැයීමේ නිර්ණායක 03**<br>1. කටහඬ නිපුනතාව<br>2. නාට්‍යෝචිතව අවස්ථාව ගොඩනැංවීම<br>3. ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය |
| A3 ඇගැයීම | කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම - (අනිවාර්ය)<br><br>**තමන් කැමති ඕනෑම සමාජයීය, මානවීය සහ පාරිසරික සංසිද්ධියක් පාදක කරගෙන ගොඩ නංවන කතා පුවතක් ඉදිරිපත් කළ යුතු ය. මෙම ඉදිරිපත් කිරීම විනාඩි 03ත් 05ත් අතර කාලයකින් සමන්විත විය යුතු ය.** | | |
| | කතන්දර කීම. (Story Telling)<br>තමන් අභිමත සංසිද්ධියක් පාදක කරගෙන ගොඩනංවන කතා පුවතක් ඉදිරිපත් කිරීම.<br>ආනුෂංගික අංග භාවිතයට දිරිගන්වනු නොලැබේ.<br>**(කාලය විනාඩි 02-03)** | **ලකුණු 15** | **ඇගැයීමේ නිර්ණායක**<br>1. කටහඬ නිපුනතාව<br>2. ඉදිරිපත් කිරීමේ නිපුණතාවය<br>3. ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය |

## B කොටස - රූපණය / රඟපෑම (acting) ලකුණු - 15

| | | | |
|---|---|---|---|
| B1 ඇගැයීම | **සංගීතය බණ්ඩයකට අනුව ඉදිරිපත් කරන නිර්මාණාත්මක රංගනය (තේරීම්)**<br>**වාදනය වන සංගීත බණ්ඩයක් ආශ්‍රිත ව අපේක්ෂකයා විසින් ඉදිරිපත් කළ යුතු අවාචික නාට්‍යානුසාරී රංගනයකි. නූතන කාය-සංචලන රංග (Physical Theatre), නූතන නෘත්‍ය රංග (Dance Theatre) භාවිතයන් ද මෙහි ලා ඇසුරු කළ හැකි ය. නාටකීය අර්ථකථනයක් නිරූපණය වන ආකාරයට මෙම රංගනය ඉදිරිපත් කළ යුතු ය.** | | |
| | අදාල වර්ෂයේ සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රායෝගික පරීක්ෂණයට ලබා දී ඇති සංගීත බණ්ඩම මේ සඳහා භාවිතා කරන අතර ඒවායින් අපේක්ෂකයාට අහඹු ලෙස තෝරා ගැනීමට අවස්ථාව ලබා දෙන සංගීත බණ්ඩයක් ආශ්‍රිතව මෙම අවාචික රංගනය සිදු කළ යුතු ය.<br><br>**(කාලය උපරිම වි. 04)** | **ලකුණු** 15 | **ඇගැයීමේ නිර්ණායක**<br>1. සංගීත බණ්ඩයේ සුවිශේෂ ආකෘතික ලක්ෂණ හඳුනා ගැනීම හා අර්ථකථනය<br>2. මනෝභාවික අන්තර්ගතය<br>3. ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය |
| B2 ඇගැයීම | **නාට්‍ය ගීතයක් ගායනයෙන් සහ රංගනයෙන් ඉදිරිපත් කිරීම - (තේරීම්)**<br>**අයදුම්කරුට කැමති නාට්‍ය ගීතයක් ගයමින් හා රඟමින් ඉදිරිපත් කළ හැකි ය.** | | |
| | නාඩගම් සම්ප්‍රදායෙහි පටන් නූතන යුගය දක්වා වන ඕනෑ ම නාට්‍ය සම්ප්‍රදායකින්/ ශෛලියකින්/ නාට්‍යයකින් තෝරාගත් ගීතයක් ගයමින් හා රඟමින් ඉදිරිපත් කළ යුතු ය. මෙම ගීතය මුල් නාට්‍යය තුළ චරිතයක මුවින් ගායනා කෙරෙන ගීතයක් විය යුතු අතර පසුබිම් ගායනයක් නොවිය යුතුය.<br><br>**(කාලය උපරිම වි. 03)** | **ලකුණු** 15 | **ඇගැයීමේ නිර්ණායක**<br>1. සංගීතාත්මක බව, හඬ පාලනය, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය<br>2. මනෝභාවික අන්තර්ගතය<br>3. ශාරීරික ප්‍රකාශනය |
| B3 ඇගැයීම | **ගැමි නාටක / ශාන්තිකර්ම ආශ්‍රිත චරිත නිරූපණය -(තේරීම්)**<br>**දේශීය ගැමි නාටකයට අදාල නාට්‍යමය අවස්ථාවක් ආශ්‍රිතව කේවල වශයෙන් ඉදිරිපත් කළ හැකි චරිත නිරූපණයක් සිදු කළ යුතු ය. මෙම ඉදිරිපත් කිරීම විනාඩි 03ත් 05ත් අතර කාලයකින් සමන්විත විය යුතු ය.** | | |
| | අයදුම්කරු විසින් අ.පො.ස. උ/පෙළ නාට්‍ය හා රංග කලා විෂය නිර්දේශයට අදාලව දේශීය ශාන්තිකර්මවල ඇති අතුරු රංග අවස්ථා ආශ්‍රය කරගෙන හෝ සොකරි, කෝලම් ආශ්‍රය කරගෙන චරිත නිරූපණයක් කිරීම අපේක්ෂා කෙරේ.<br><br>ඉහත නිරූපණයන්හි දී අදාළ කවි ගායනා මෙන්ම සංවාද සහිතව ද චරිත නිරූපණය සිදු කිරීම අපේක්ෂිතය.<br>(කාලය වි. 03-05) | **ලකුණු** 15 | **ඇගැයීමේ නිර්ණායක**<br>1. චරිතයට අදාළ සංවාද හා ගායනා ආශ්‍රිත කටහඬ නිපුණතාව<br>2. චරිතයට අනුකූල වීම<br>3. ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය |

Artsapi.lk

C කොටස නාට්‍ය නිෂ්පාදනය සහ ආනුෂංගික කලා පිළිබඳ ඇගයීම් ලකුණු- 15

| | | | |
|---|---|---|---|
| **C 1 ඇගැයීම** | **අංග රචන නිර්මාණ සැලසුම/ අංගරචනය (Make Up Design) (තේරීම්)** | | |
| | විෂය නිර්දේශයට ඇතුළත් පෙළ අතරින් අහඹු ලෙස තෝරා ගන්නා කොටසක චරිතයට අදාළ අංග රචනය පිළිබඳ පිරිසැලසුමක් (design) සැකසීම අපේක්ෂා කෙරේ.<br><br>(**කාලය උපරිම වි 60**) | **ලකුණු** 15 | **ඇගැයීමේ නිර්ණායක**<br>1. ශෛලිය, යුගය, නිෂ්පාදනයේ ස්වරූපය හා කාලීන බව හඳුනා ගැනීම<br>2. මුහුණේ කොටස් පිළිබඳ අවබෝධය සහ චරිතයට අදාළ සුවිශේෂතා හඳුනා ගැනීම<br>3. නිර්මාණ සැලසුම්කරණය හා දෘශ්‍ය සන්නිවේදනය |
| **C 2 ඇගැයීම** | **වේශභූෂණ නිර්මාණ සැලසුම (Costume Design) (තේරීම්)** | | |
| | විෂය නිර්දේශයට ඇතුළත් පෙළ අතරින් අහඹු ලෙස තෝරා ගන්නා කොටසක චරිතයට අදාළ රංග වස්ත්‍ර නිර්මාණය පිළිබඳ පිරිසැලසුමක් (design) සැකසීම අපේක්ෂා කෙරේ.<br><br>(**කාලය උපරිම වි 60**) | **ලකුණු** 15 | **ඇගැයීමේ නිර්ණායක**<br>1. ශෛලිය, යුගය, නිෂ්පාදනයේ ස්වරූපය හා කාලීන බව හඳුනා ගැනීම<br>2. සිරුරේ කොටස් පිළිබඳ අවබෝධය සහ චරිතයට අදාළ සුවිශේෂතා හඳුනා ගැනීම<br>3. නිර්මාණ සැලසුම්කරණය හා දෘශ්‍ය සන්නිවේදනය |
| **C 3 ඇගැයීම** | **පසුතල නිර්මාණ සැලසුම (Set Design) - (තේරීම්) පසුතලය/ පසුතල සැකැස්ම** | | |
| | විෂය නිර්දේශයට ඇතුළත් පෙළ අතරින් මෙම ඇගැයීම සඳහා භාවිතා කිරීමට යෝග්‍ය නාට්‍ය පෙළකින් අහඹු ලෙස තෝරාගන්නා කොටසක චරිතයට අදාළ ජවනිකාවේ පසුතලය පිළිබඳ පිරිසැලසුමක් (design) සැකසීම අපේක්ෂා කෙරේ.<br><br>(**කාලය උපරිම වි 60**) | **ලකුණු** 15 | **ඇගැයීමේ නිර්ණායක**<br>1. ශෛලිය, යුගය, නිෂ්පාදනයේ ස්වරූපය හා කාලීන බව හඳුනා ගැනීම<br>2. රංග අවකාශය පිළිබඳ අවබෝධය සහ ජවනිකාවට අදාළ සුවිශේෂතා හඳුනා ගැනීම<br>3.නිර්මාණ සැලසුම්කරණය හා දෘශ්‍ය සන්නිවේදනය |

Artsapi.lk

## C කොටස

මෙම කොටස විභාග අපේක්ෂකයා ආනුෂංගික විෂය ක්ෂේත්‍ර පිළිබඳ ව දක්වන නිපුණතා ඇගයීමට යොදා ගැනීමට අපේක්ෂිතය. මෙහි දී මූලික වශයෙන්, 1. අංග රචනය 2. රංග පසුතල 3. රංග වස්ත්‍ර යන ක්ෂේත්‍ර ආවරණය වේ.

විභාග අපේක්ෂකයා අ.පො.ස. උ.පෙළ නාට්‍ය හා රංග කලා විෂයට **නිර්දේශිත නාට්‍ය පෙළ** ඇසුරෙන් මෙම පරීක්ෂණය සඳහා ඉදිරිපත් වීම අපේක්ෂා කෙරේ. ඉහත ක්ෂේත්‍ර ත්‍රිත්වයෙන් විභාග අපේක්ෂකයා තම අභිමතය පරිදි තෝරා ගත් එක් ක්ෂේත්‍රයකින් පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුය.
ප්‍රායෝගික පරීක්ෂණය සඳහා විනාඩි 60ක කාලයක් හිමි වේ.

- ★ නිර්දිෂ්ට පෙළ ඇසුරෙන් අපේක්ෂකයා අභිමත ලෙස තෝරා ගන්නා චරිතයට අදාළ අංග රචනය, රංග වස්ත්‍රය හෝ ඒ ආශ්‍රිත ජවනිකාවට අදාළ පසුතල සැකැස්ම සැලසුම් කර ඉදිරිපත් කළ යුතුය.
- ★ මේ සඳහා අවශ්‍ය පැන්සල්, පාට පැන්සල් හෝ පැස්ටල් කූරු අපේක්ෂකයා විසින් සපයා ගත යුතුය.
- ★ සැලසුම ඇඳීම සඳහා අවශ්‍ය කඩදාසි විභාග දෙපාර්තමේන්තුව විසින් සපයනු ලැබේ. එම කඩදාසි මේ සමග අමුණා ඇති නිදර්ශක මුහුණු/ ශරීර/ වේදිකා සැලසුම සහිතව A3 ප්‍රමාණයෙන් ලබා දේ. පසුතල නිර්මාණ සැලසුමේ දී වේදිකාවේ ගුවනින් දිස්වන ආකාරයෙන් මෙන්ම (Birds eye view) ප්‍රේක්ෂකාගාර දෘෂ්ටි කෝණයෙන් ද සැලසුම ඉදිරිපත් කල යුතු ය.

**C කොටසෙහි පරීක්ෂණය පැවැත්වෙන ආකාරය**

- ★ තමන්ට නියමිත ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වෙන දිනයේ පෙ:ව 8.30 වන විට එදිනට විභාගයට පෙනී සිටීමට නියමිත අපේක්ෂකයින් පරීක්ෂණ මධ්‍යස්ථානයට පැමිණිය යුතුය.
- ★ පෙ.ව 8.30 - 9.00 අතර ප්‍රධාන පරීක්ෂක විසින් අවශ්‍ය උපදෙස් අපේක්ෂකයන්ට ලබා දෙන අතර පෙ.ව 9.00 ට එදිනට අදාළ අපේක්ෂකයන් සඳහා ප්‍රයෝගික පරීක්ෂණ ඇරඹේ.
- ★ විනාඩි 60 ක කාලයක් ලැබෙන 'C' කොටසට අදාළ පරීක්ෂණය පෙ.ව 10.00 ට සමාප්ත වේ.
- ★ පෙ.ව 10.30 ට නැවත 'A' හා 'B' කොටස්වලට අදාළ පරීක්ෂණය ආරම්භ කෙරේ.
- ★ 'A' හා 'B' කොටස අවසන් කරන අපේක්ෂකයන් 'D' කොටස හෙවත් වාචික පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

Artsad.lk

## D කොටස - අපේක්ෂකයා ඉදිරිපත් වූ ඉහත හා කොටස්වලට අදාල වාච්‍ය පරීක්ෂණය - ලකුණු 10

| | | | |
|---|---|---|---|
| **ඇගැයීම 01** | අපේක්ෂකයා විසින් ඉදිරිපත් වූ 'B' හා 'C' කොටස් වලට අදාළව මෙම වාචික පරීක්ෂණය සිදු කෙරෙයි.<br><br>වාචික පරීක්ෂණය සඳහා ලකුණු **10**ක් හිමි වේ. | **ලකුණු** - 10 | **ඇගැයීමේ නිර්ණායක**<br><br>1. B කොටසෙන් අයදුම්කරු ඉදිරිපත් කළ ක්‍රියාකාරකම පාදකව ඊට කොටසට අදාළ ඇගැයීම් නිර්ණායකවලට අනුකූලව පරීක්ෂක මණ්ඩලය විසින් අසනු ලබන ප්‍රශ්න සඳහා පිළිතුරු ලබාදීම. **(ල.05)**<br><br>2. C කොටසෙන් අයදුම්කරු ඉදිරිපත් කළ ක්‍රියාකාරකම පාදකව ඊට කොටසට අදාළ ඇගැයීම් නිර්ණායකවලට අනුකූලව පරීක්ෂක මණ්ඩලය විසින් අසනු ලබන ප්‍රශ්න සඳහා පිළිතුරු ලබාදීම. **(ල.05)** |

## A 1-1 ඇගැයීම: පෙළ ආශ්‍රිත භාෂණ රංගනය- අයදුම්කරු පුහුණු වී පැමිණෙන පෙළ කොටස

| ඇගැයීම් නිර්ණායක | 5 - විශිෂ්ට යි | 4 - ඉතා හොඳ යි | 3 - හොඳ යි | 2 - වැඩි දියුණු කළ යුතු යි | 1- දුර්වල යි | 0 - ඉතා දුර්වල යි |
| --- | --- | --- | --- | --- | --- | --- |
| කටහඬ නිපුණතාව | ප්‍රශස්ත හඬ ප්‍රක්ෂේපණයක් සහිතයි. හඬ පෞරුෂය අදාළ පෙළ භාෂණය සමග මැනවින් ගලපා ගනියි. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. භාෂණය පහසුවෙන් වටහාගත හැකි යි. ප්‍රකාශන ගුණයෙන් ඉතා පොහොසත් වේ. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත යි. තානීය විවිධත්වය නිර්මාණාත්මක ව භාවිත කරයි. චරිතය මැනැවින් පිළිබිඹු වේ. | පැහැදිලි ව හා නිවැරදි ව උච්චාරණය කරයි. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත යි. හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත මට්ටමක පවතී. චරිතයට ගැළපෙන, එය මැනැවින් නිරූපණය වන උච්චාරණයකි. තානීය විවිධත්වය ඉතා හොඳ යි. | පැහැදිලි හා නිවැරදි උච්චාරණයක් සහිත යි. හඬ ප්‍රක්ෂේපණය පිළිබඳ සැළකිළිමත් වෙමින් කටහඬ පාලනය කරයි. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත යි. චරිතයට ගැළපෙන උච්චාරණයක් බොහෝ අවස්ථාවල ප්‍රකට කරයි. එහෙත් තානීය විවිධත්වය, ප්‍රක්ෂේපණය හා උච්චාරණ විලාසයන් තවත් වැඩිදියුණු කිරීමේ හැකියාව හා කුශලතාව පැහැදිලි ව දක්නට ඇත. | ප්‍රකාශනාත්මක ගුණයෙන් යුතු අවස්ථා ඇත. පැහැදිලි උච්චාරණයක් ප්‍රකට කළත් වාක්‍ය/ වචන අග දී හඬ වියැකී යයි. මනා හඬ ප්‍රක්ෂේපණයකට යත්න දරයි. චරිතයට අනුකූල උච්චාරණයක් විටින් විට දැකිය හැකි නමුත් ඉන් චරිතය මැනැවින් විශද නො වේ. | උච්චාරණය දුර්වල යි/ ඒකාකාරී තානයකින් යුතු ය/ ප්‍රකාශන ගුණයෙන් හීන ය. හුදු පෙළ කියවීමකි. අනවශ්‍ය ලෙස වේගවත් ය/ මන්දගාමී ය/ අපහසුවෙන් ශ්‍රවණය කළ හැකි ය. අපැහැදිලි ය. උච්චාරණ විලාසය චරිතයට අදාළ නැත. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නොකර යි/ ඇගයීම සඳහා කිසිදු සූදානමක් නැත/ ඉදිරිපත් කිරීමක් කළ ද කිසිදු හඬ ප්‍රක්ෂේපණයක් නොවේ. |
| පෙළ ස්මරණය | අනායාසයෙන් සිදු කරන පෙළ ස්මරණය බාහිරව නොපෙනෙන පරිදි රංග කාර්යය සඳහා යොදා ගනියි. තෝරාගත් පෙළ කොටසට අනුකූලව රංග විධාන ආදියෙහි වැදගත්කම පිළිබඳ මනා අවබෝධයකින් රූපණ කාර්යයේ නිරත වේ. | මනා ස්මරණයෙන් යුතුව අඛණ්ඩව පෙළ ආශ්‍රිත රංගනයේ නිරත වෙයි. මනා පුහුණුවක් ප්‍රකට කරයි. පෙළ කොටසෙහි අර්ථය මතුවන පරිදි පෙළ ස්මරණය කරයි. | අඛණ්ඩ භාෂණයක නිරත වුවද පෙළ ස්මරණය සඳහා උත්සහ ගැනීම ප්‍රකට වේ. මනා පුහුණුවක් පෙන්නුම් කරයි. වචන කෙරෙහි අවධනය යොමු කළ ද නිවැරදි අරුත් සහ රංග විධාන පිළිබඳ වැටහීමක් නැත. | ස්මරණය කරන පෙළ කොටස අඛන්ඩ ගලා යෑමක් පෙන්නුම් කළ ද වරින් වර අමතක වීම් සිදු වේ. යම් පුහුණුවක් පෙන්නුම් කරයි. පෙළ ස්මරණය සඳහා උත්සහ ගැනීමට කාලය මිඩංගු කරයි. | තෝරා ගෙන ඇති පෙළ කොටස ඉතා අපහසුවෙන් ස්මරණය කිරීමට උත්සාහ කරයි. අල්ප පුහුණුවක් ඇති බව ප්‍රකට වේ. ස්මරණය කරන පෙළ කොටස අඛණ්ඩ ගලා යාමකින් තොරය. | ඉදිරිපත් කිරීමක් සිදු නොකර යි/ තෝරාගත් පෙළ කොටස ස්මරණය කිරීමට අපොහොසත් ය. ස්මරණය සඳහා කිසිදු උත්සහයක් නැත. |
| චරිත නිරූපණය | සමස්ත ඉදිරිපත් කිරීම තුළ නළුවා/ නිළිය චරිතය මුළුමණින්ම ස්වීකරණය කරගෙන, ඊට අනන්‍ය ව ඇත. පෙළ මගින් ප්‍රදානය කර ඇති දෙන ලද තත්වයන් පිළිබද මනා අවබෝධයකින් රංගනයේ යෙදෙයි. සියුම් යටි පෙළ අරුත් ආශ්‍රිත සංකීරණතාව ඉස්මතු වන ආකාරයෙන් සහ පෙළෙහි නිරූපිත අදාළ චරිත ස්වභාවයට හානි නොවන ආකාරයේ ස්වාධීන ගොඩනැංවීමකි. | චරිත ස්වභාවය සහ අවස්ථාව පිළිබඳ අවබෝධයෙන් චරිතය ස්වීකරණය කරගෙන තිබේ. එය මැනැවින් නිරූපණය වේ. චරිතය පිළිබඳ විශ්වසනීය ඉදිරිපත් කිරීමකි. | චරිත ස්වභාවය සහ අවස්ථාව ඉස්මතු වී පෙනේ. චරිතය තුළ රැඳී සිටීමට උත්සාහ දරයි. ඉදිරිපත් කිරීම තුළ චරිතය පිළිබඳ යම් විශ්වසනීයත්වයක් ගොඩ නැගේ. | ඉදිරිපත් කිරීම තුළ චරිත ස්වභාවය පිළිබිඹු කිරීමට ප්‍රයත්න දරයි. එහෙත් එය ස්ථාවර නැත. චරිතයේ අනන්‍යතාව පැහැදිලි ව විශද නොවේ. | ඉදිරිපත් කිරීම තුළ චරිතයේ ඡායාමාත්‍රයක් දැකිය හැකි ය. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කළ ද, චරිතය හා අවස්ථාව පිළිබඳ කිසිදු වැටහීමක් නැත. |

| ඇගැයීම් නිර්ණායක | 5 - විශිෂ්ට යි | 4 - ඉතා හොඳ යි | 3 - හොඳ යි | 2 - වැඩි දියුණු කළ යුතු යි | 1- දුර්වල යි | 0 - ඉතා දුර්වල යි |
|---|---|---|---|---|---|---|
| **ප්‍රේක්ෂක සහසම්බන්ධය** | ආකර්ශනීය මෙන්ම අඛණ්ඩ ප්‍රේක්ෂක සහසම්බන්ධයක් ගොඩනගා ගැනීමට සමත්ය. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරමින් අවකාශය හසුරුවා ගන්නා අතර මනා පුහුණුවීම් මගින් සුසර කරගත් ශාරීරික චලන හා මනෝභාවයන් ප්‍රකට කරයි. | අඛණ්ඩ ප්‍රේක්ෂක සහ සහසම්බන්ධයක් ගොඩනගා ගැනීමට සමත් ය. අවකාශය මෙන්ම ශාරීරික චලන අර්ථාන්විත ව හසුරුවා ගනියි. | ප්‍රේක්ෂක අවධානය රඳවා ගැනීමට සමත් වුව ද එය අඛණ්ඩව පවත්වා ගැනීමට අපොහොසත්ය. අවකාශය භාවිතය සහ ශාරීරික චලන අවබෝධයකින් යුතුව රංග කාර්ය සඳහා යොදා ගනියි. | ඉදිරිපත් කිරීම තුළ චරිතයට හා අවස්ථාවට අදාළ ප්‍රේක්ෂක සහසම්බන්ධයක් ගොඩ නැංවුව ද එය ඉක්මනින් බිඳ ගනියි. තම රූපණය සඳහා අවකාශය ගැලපෙන පරිදි හසුරුවා ගැනීමට උත්සුක වෙයි.ශාරීරික ප්‍රකාශනය ද තම රූපණයට ගැලපෙන ලෙස යොදා ගැනීමට යත්න දරයි. | ඉදිරිපත් කිරීමෙහි දී ප්‍රේක්ෂක සහසම්බන්ධයක් ගොඩ නැංවීමට උත්සහ දරයි. එහෙත් එය චරිතයට හා අවස්ථාවට එතරම් අනුකූල නැත.  සබකෝලය හෝ පුහුණුව මද කම වඩාත් ප්‍රකට කරයි. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කළ ද එහි කිසිදු සහසම්බන්ධයක් ප්‍රකට නොකරයි. |

## A 1-2 ඇගැයීම: පෙළ ආශ්‍රිත භාෂණ රංගනය- පරීක්ෂක මණ්ඩලය ලබා දෙන පෙළ කොටස පාඨනය කිරීම

| ඇගැයීම් නිර්ණායක | 5 - විශිෂ්ට යි | 4 - ඉතා හොඳ යි | 3 - හොඳ යි | 2 - වැඩි දියුණු කළ යුතු යි | 1- දුර්වල යි | 0 - ඉතා දුර්වල යි |
|---|---|---|---|---|---|---|
| කටහඬ, නිපුණතාව | ප්‍රශස්ත හඬ ප්‍රක්ෂේපණයක් සහිතයි. හඬ පෞරුෂය අදාළ පෙළ භාෂණය සමග මැනවින් ගළපා ගනියි. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. භාෂණය පහසුවෙන් වටහාගත හැකි ය. ප්‍රකාශන ගුණයෙන් ඉතා පොහොසත් වේ. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත යි. තානීය විවිධත්වය නිර්මාණාත්මක ව භාවිත කරයි. චරිතය මැනැවින් පිළිබිඹු වේ. | පැහැදිළි ව හා නිවැරදි ව උච්චාරණය කරයි. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත යි. හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත මට්ටමක පවතී. චරිතයට ගැළපෙන, එය මැනැවින් නිරූපණය වන උච්චාරණයකි. තානීය විවිධත්වය ඉතා හොඳ යි. | පැහැදිළි හා නිවැරදි උච්චාරණයක් සහිත යි. හඬ ප්‍රක්ෂේපණය පිළිබඳ සැළකිළිමත් වෙමින් කටහඬ පාලනය කරයි. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත යි. චරිතයට ගැළපෙන උච්චාරණයක් බොහෝ අවස්ථාවල ප්‍රකට කරයි. එහෙත් තානීය විවධත්වය, ප්‍රක්ෂේපණය හා උච්චාරණ විලාසයන් තවත් වැඩිදියුණු කිරීමේ හැකියාව හා කුශලතාව පැහැදිළි ව දක්නට ඇත. | ප්‍රකාශනාත්මක ගුණයෙන් යුතු අවස්ථා ඇත. පැහැදිලි උච්චාරණයක් ප්‍රකට කළත් වාක්‍ය/ වචන අග දී හඬ වියැකී යයි. මනා හඬ ප්‍රක්ෂේපණයකට යත්න දරයි. චරිතයට අනුකූල උච්චාරණයක් විටින් විට දැකිය හැකි නමුත් ඉන් චරිතය මැනැවින් විශද නො වේ. | උච්චාරණය දුර්වල යි/ ඒකාකාරී තානයකින් යුතු ය/ ප්‍රකාශන ගුණයෙන් හීන ය. හුදු පෙළ කියවීමකි. අනවශ්‍ය ලෙස වේගවත් ය/ මන්දගාමී ය/ අපහසුවෙන් ශ්‍රවණය කළ හැකි ය. අපැහැදිළි ය. උච්චාරණ විලාසය චරිතයට අදාළ නැත. | එක්කෝ පාඨනය කිරීමක් සිදු නොකර යි/ ඇගැයීම සඳහා කිසිදු සූදානමක් නැත/ ඉදිරිපත් කිරීමක් කළ ද කිසිදු හඬ ප්‍රක්ෂේපණයක් නොවේ. |
| භාවාත්මක නිරූපණය | හඬ පෞරුෂය මැනවින් හසුරුවා ගනිමින් චරිතයේ සංකීර්ණ මනෝභාවයන් නිරූපණයේ දී විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. | මනෝභාවික සංකීර්ණතාවන් මැනැවින් පිළිබිඹු කරයි. | ඉදිරිපත් කිරීමෙහි ඇති මනෝභාවික අන්තර්ගතය චරිතයට, අවස්ථාවට, නාට්‍යයට සහ ශෛලියට බෙහෙවින් අනුකූල වේ. | ඉදිරිපත් කිරීම තුළ චරිතයට හා අවස්ථාවට අදාළ මනෝභාවික ලක්ෂණයන් යම් පමණකින් පිළිබිඹු කරයි. | ඉදිරිපත් කිරීමෙහි යම් මනෝභාවික අන්තර්ගතයක් ඇත. එහෙත් එය චරිතයට හා අවස්ථාවට එතරම් අනුකූල නැත. | පාඨනය කිරීමක් සිදු නො කරයි/ පාඨනය කළ ද එහි මනෝභාවික අන්තර්ගතයක් නැත. |

## A 2 ඇගැයීම: චරිත නිරූපණය

| ඇගැයීම් නිර්ණායක | 5 - විශිෂ්ට යි | 4 - ඉතා හොඳ යි | 3 - හොඳ යි | 2 - වැඩි දියුණු කළ යුතු යි | 1- දුර්වල යි | 0 - ඉතා දුර්වල යි |
|---|---|---|---|---|---|---|
| කටහඬ නිපුණතාවය | ප්‍රශස්ත හඬ ප්‍රක්ෂේපණයක් සහිතයි. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. භාෂණය පහසුවෙන් වටහාගත හැකි යි. ප්‍රකාශන ගුණයෙන් ඉතා පොහොසත් වේ. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත යි. තානීය විවිධත්වය නිර්මාණාත්මක ව භාවිත කරයි. චරිතය මැනැවින් පිළිබිඹු වේ. | පැහැදිළි ව හා නිවැරදි ව උච්චාරණය කරයි. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත යි.හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත මට්ටමක පවති. චරිතයට ගැළපෙන, එය මැනැවින් නිරූපණය වන උච්චාරණයකි. තානීය විවිධත්වය ඉතා හොඳ යි. | පැහැදිළි හා නිවැරදි උච්චාරණයක් සහිත ය. හඬ ප්‍රක්ෂේපණය පිළිබඳ සැළකිළිමත් වෙමින් කටහඬ පාලනය කරයි. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත ය. චරිතයට ගැළපෙන උච්චාරණයක් බොහෝ අවස්ථාවල ප්‍රකට කරයි. එහෙත් තානීය විවධත්වය, ප්‍රක්ෂේපණය හා උච්චාරණ විලාසයන් තවත් වැඩිදියුණු කිරීමේ හැකියාව හා කුශලතාව පැහැදිළි ව දක්නට ඇත. | ප්‍රකාශනාත්මක ගුණයෙන් යුතු අවස්ථා ඇත. පැහැදිලි උච්චාරණයක් ප්‍රකට කළත් වාක්‍ය/වචන අග දී හඬ වියැකී යයි. මනා හඬ ප්‍රක්ෂේපණයකට යත්න දරයි. චරිතයට අනුකූල උච්චාරණයක් විටින් විට දැකිය හැකි නමුත් ඉන් චරිතය මැනැවින් විශද නො වේ. | උච්චාරණය දුර්වල යි/ ඒකාකාරී තානයකින් යුතු ය/ ප්‍රකාශන ගුණයෙන් හීන ය. හුදු පෙළ කියවීමකි. අනවශ්‍ය ලෙස වේගවත් ය/ මන්දගාමී ය/ අපහසුවෙන් ශ්‍රවණය කළ හැකි ය. අපැහැදිළි ය. උච්චාරණ විලාසය චරිතයට අදාළ නැත. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නොකර යි/ ඇගැයීම සඳහා කිසිදු සූදානමක් නැත /ඉදිරිපත් කිරීමක් කළ ද කිසිදු හඬ ප්‍රක්ෂේපණයක් නොවේ. |
| නාට්‍යෝචිතව අවස්ථාව ගොඩ නැංවීම | නිර්මාණශීලී පරිකල්පනයකින් යුතු ව දී ඇති මාතෘකාව විනිවිද ගිය, අපූර්වත්වයකින් යුතු ක්‍රියා විකාශනයකින් සමන්විත නාට්‍යමය කූට ප්‍රාප්තියක් කරා යොමු කෙරේ. | ආරම්භයේ පටන් ක්‍රමානුකූල ව නාට්‍යමය කූටප්‍රාප්තියක් කරා ඉලක්කගත වූ ක්‍රියා විකාශනයකින් යුක්ත වේ. | ඉදිරිපත් කරන සිදුවීම තුළ නාට්‍යෝචිත අවස්ථා ගොඩ නැංවේ. එය අවසාන මාතෘකාවට/තේමාවට අනුකූල වේ. | ඉදිරිපත් කරන සිදුවීම තුළ යම් නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩ නැගුණ ද එය සංවර්ධනය වී නැත. | යම් කිසි ක්‍රියාවක් (සිද්ධියක් ඉදිරිපත් වේ) නාට්‍යමය අවස්ථාවක් නැත. එක්කෝ සිදු වීම අතර මගින් අවසන් වේ. | ඉදිරිපත් කිරීමක් සිදු නොකරයි. |
| ශාරීරික ප්‍රකාශනය, සහ අවකාශ භාවිතය | විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. රංග කාර්යය සිදු වන සීමිත අවකාශයේ භාවිතය හා ශාරීරික ප්‍රකාශනයන් අතිශයින් ම නිර්මාණාත්මක ය. චරිතවල සහ සිදුවීම්වල ගැඹුර ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. | චරිත/ සිද්ධිවල අවශ්‍යතාවට අනුකූල ව චලනය විය යුතු ආකාරයන් පිළිබඳ හා අවකාශ භාවිතය පිළිබඳ දැනුවත් තෝරාගැනීම් සහිත ය. රංගන අවකාශයේ සීමාසහිත බව නොතකා මැනැවින් තම ඉදිරිපත් කිරීම සිදු කරයි. | තේරාගන්නා ශාරීරික චලනයන්, හා අවකාශ භාවිතයන් බොහෝ විට චරිතයන්ට හා අවස්ථාවන්ට ගැලපෙන, ඒවා විසින් ඉල්ලා සිටිනු ලබන චලන වේ. රංගන අවකාශය පිළිබඳ වැටහීමකින් යුතුව ඉදිරිපත් කිරීම සිදු කරයි. | ඉදිරිපත් කරන ශාරීරික චලන හා අවකාශ භාවිතයන් යම් පමණකින් චරිත හා අවස්ථාවන් ඉස්මතු කරවන සුලු වුවත් ඒවා මැනැවින් නිරූපණය නොකෙරේ. ලැබී ඇති සීමිත රංගන අවකාශය පිළිබඳ වැටහීම හා අවධානය ප්‍රමාණවත් නැත. | යම් ශාරීරික ප්‍රකාශනයක් හා අවකාශ භාවිතයක් තිබේ. එහෙත් එය ප්‍රමාණවත් නැත. නොගැළැපෙන හා අනවබෝධයෙන් යුතු ඉදිරිපත් කිරීමකි. ලබා දී ඇති රංගන අවකාශය පිළිබඳ කිසිදු සැලකීමක් හෝ අවබෝධයක් නැත. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කළ ද නො ගැළපෙන, අනවබෝධයෙන් යුතු ශාරීරික ප්‍රකාශනයක් සහ අවකාශ භාවිතයකි. |

Artsoil.lk

# A 3 ඇගැයීම: කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම

| ඇගැයීම් නිර්ණායක | 5 - විශිෂ්ට යි | 4 - ඉතා හොඳ යි | 3 - හොඳ යි | 2 - වැඩි දියුණු කළ යුතු යි | 1- දුර්වල යි | 0 - ඉතා දුර්වල යි |
|---|---|---|---|---|---|---|
| කටහඬ, නිපුණතාවය | ප්‍රශස්ත හඬ ප්‍රක්ෂෙප්ණයක් සහිතයි. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. භාෂණය පහසුවෙන් වටහාගත හැකි යි. ප්‍රකාශන ගුණයෙන් ඉතා පොහොසත් වේ. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත ය. තානීය විවිධත්වය නිර්මාණාත්මක ව භාවිත කරයි. චරිතය මැනැවින් පිළිබිඹු වේ. උචිත සාත්වික අභිනයන් භාවිතා කරයි. | පැහැදිළි ව හා නිවැරදි ව උච්චාරණය කරයි. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත ය. හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත මට්ටමක පවති. කතා පුවතේ අවශ්‍යතාවයන්ට ගැළපෙන, එය මැනැවින් නිරූපණය වන උච්චාරණයකි. තානීය විවිධත්වය ඉතා හොඳ යි. උචිත සාත්වික අභිනයන් භාවිතා කරයි. | පැහැදිළි හා නිවැරදි උච්චාරණයක් සහිත ය. හඬ ප්‍රක්ෂේපණය පිළිබද සැළකිළිමත් වෙමින් කටහඬ පාලනය කරයි. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත ය. කතා පුවතේ අවශ්‍යතාවයන්ට ගැළපෙන උච්චාරණයක් බොහෝ අවස්ථාවල ප්‍රකට කරයි.එහෙත් තානීය විවධත්වය, ප්‍රක්ෂේපණය හා උච්චාරණ විලාසයන් තවත් වැඩිදියුණු කිරීමේ හැකියාව හා කුශලතාව පැහැදිළි ව දක්නට ඇත. | ප්‍රකාශනාත්මක ගුණයෙන් යුතු අවස්ථා ඇත. පැහැදිලි උච්චාරණයක් ප්‍රකට කළත් වාක්‍ය/වචන අග දී හඬ වියැකී යයි. මනා හඬ ප්‍රක්ෂේපණයකට යත්න දරයි. කතා පුවතේ අවශ්‍යතාවයන්ට අනුකූල උච්චාරණයක් විටින් විට දැකිය හැකි නමුත් ඉන් චරිතය මැනැවින් විශද නො වේ. | උච්චාරණය දුර්වල යි/ ඒකාකාරී තානයකින් යුතු ය/ ප්‍රකාශන ගුණයෙන් හීන ය. හුදු පෙළ කියවීමකි. අනවශ්‍ය ලෙස වේගවත් ය/ මන්දගාමී ය/ අපහසුවෙන් ශ්‍රවණය කළ හැකි ය. අපැහැදිළි ය. උච්චාරණ විලාසය චරිතයට අදාළ නැත. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නොකර යි/ ඇගැයීම සඳහා කිසිදු සූදානමක් නැත/ ඉදිරිපත් කිරීමක් කළ ද කිසිදු හඬ ප්‍රක්ෂේපණයක් නොවේ |
| ඉදිරිපත් කිරීමේ නිපුණතාවය | නිර්මාණශීලී පරිකල්පනයකින් යුතු ව තම කතා පුවත විනිවිද දුටු සහ අපූර්වත්වයකින් යුතු ක්‍රියා විකාශනයකින් සමන්විත නාට්‍යමය කූට ප්‍රාප්තියක් කරා යොමු කෙරේ. | ආරම්භයේ පටන් ක්‍රමානුකූල ව නාට්‍යමය කූටප්‍රාප්තියක් කරා ඉලක්කගත වූ ක්‍රියා විකාශනයකින් යුක්ත වේ. | ඉදිරිපත් කරන කතා පුවත තුළ නාට්‍යෝචිත අවස්ථා ගොඩ නැංවේ. එය අවසාන මාතෘකාවට/තේමාවට අනුකූල වේ. | ඉදිරිපත් කරන කතා පුවත තුළ යම් නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩ නැගුණ ද එය සංවර්ධනය වී නැත. | යම් කිසි ක්‍රියාවක් (සිද්ධියක් ඉදිරිපත් වේ) නාට්‍යමය අවස්ථාවක් නැත. එක්කෝ සිදු වීම අතර මගින් අවසන් වේ. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි. |
| ශාරීරික ප්‍රකාශනය, සහ අවකාශ භාවිතය | විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. රංග කාර්යය සිදු වන සීමිත අවකාශයේ භාවිතය හා ශාරීරික ප්‍රකාශනයන් අතිශයින් ම නිර්මාණාත්මක ය. චරිතවල සහ සිදුවීම්වල ගැඹුර ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. | චරිත/ සිද්ධිවල අවශ්‍යවතාවට අනුකූල ව චලනය විය යුතු ආකාරයන් පිළිබඳ හා අවකාශ භාවිතය පිළිබඳ දැනුවත් තෝරා ගැනීම් සහිත ය. රංගන අවකාශයේ සීමාසහිත බව නොතකා මැනැවින් තම ඉදිරිපත් කිරීම සිදු කරයි. | තේරාගන්නා ශාරීරික චලනයන්, හා අවකාශ භාවිතයන් බොහෝ විට චරිතයන්ට හා අවස්ථාවන්ට ගැලපෙන, ඒවා විසින් ඉල්ලා සිටිනු ලබන චලන වේ. රංගන අවකාශය පිළිබඳ වැටහීමකින් යුතුව ඉදිරිපත් කිරීම සිදු කරයි. | ඉදිරිපත් කරන ශාරීරික චලන හා අවකාශ භාවිතයන් යම් පමණකින් චරිත හා අවස්ථාවන් ඉස්මතු කරවන සුළු වුවත් ඒවා මැනැවින් නිරූපණය නොකෙරේ. ලැබී ඇති සීමිත රංගන අවකාශය පිලිබඳ වැටහීම හා අවධානය ප්‍රමාණවත් නැත. | යම් ශාරීරික ප්‍රකාශනයක් හා අවකාශ භාවිතයක් තිබේ. එහෙත් එය ප්‍රමාණවත් නැත. නොගැළැපෙන හා අනවබෝධයෙන් යුතු ඉදිරිපත් කිරීමකි. ලබා දී ඇති රංගන අවකාශය පිලිබඳ කිසිදු සැලකීමක් හෝ අවබෝධයක් නැත. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කළ ද නො ගැළපෙන, අනවබෝධයෙන් යුතු ශාරීරික ප්‍රකාශනයක් සහ අවකාශ භාවිතයකි. |

## B 1 ඇගැයීම: සංගීත ඛණ්ඩයකට අනුව ඉදිරිපත් කරන නිර්මාණාත්මක රංගනය

| ඇගැයීම් නිර්ණායකය | 5- විශිෂ්ටයි | 4- ඉතා හොඳයි | 3- හොඳයි | 2- වැඩි දියුණු කළ යුතුයි | 1- දුර්වලයි | 0- ඉතා දුර්වලයි |
|---|---|---|---|---|---|---|
| සංගීත ඛණ්ඩයේ සුවිශේෂී ආකෘතික ලක්ෂණ හඳුනා ගැනීම හා අර්ථකථනය | විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන් හඳුනාගෙන ඇත. එම නාදමය සුවිශේෂතාවන් මගින් ප්‍රමුඛව ගම්‍ය කරවන අරුත් ඉක්මවා යමින් සංකීර්ණ/ ප්‍රබල/ සියුම් නව අර්ථකථනයකින් යුත් නාටකීය අවස්ථාවක්/සිදුවීමක් ගොඩ නංවයි. | සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන් හඳුනාගෙන ඇත. ඊට නාටකීය බවකින් යුතු අවස්ථාවක්/සිදුවීමක් ආශ්‍රිත අර්ථයක් සම්පාදනය කරයි. | සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන් හඳුනාගෙන ඇත. ඊට අර්ථයක් සම්පාදනය කරයි. | සංගීත ඛණ්ඩයේ යම් යම් ආකෘතික ලක්ෂණ හඳුනාගෙන ඇත. එම ආකෘතික ලක්ෂණවලට යම් අර්ථකථනයක් සපයන බව පෙනේ. එහෙත් එය තවත් සංවර්ධනය විය යුතු ය. එක්කෝ අර්ථකථනය ප්‍රමාණවත් නැත, නැතහොත් අර්ථකථනය සංගීත ඛණ්ඩයේ ලක්ෂණ හා අනුගත නැත. | සංගීත ඛණ්ඩයේ යම් යම් ආකෘතික ලක්ෂණ හඳුනාගත් බව පෙනේ. එහෙත් යම් ආකාරයක අර්ථයක් සැපයීමට උත්සාහ කරන බවක් නොපෙනේ. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ නැතහොත් ඉදිරිපත් කිරීමක් කළ ද, සංගීත ඛණ්ඩය හඳුනා ගෙන නැත. කිසිදු අර්ථයක් ප්‍රකාශ කිරීමට සමත් නො වේ. |
| මනෝභාවික අන්තර්ගතය | සියුම් මනෝභාවික සංකීර්ණතාවන් ඉස්මතු වන ආකාරයෙන් සහ සංගීත ඛණ්ඩය මගින් ප්‍රමුඛ ලෙස ගම්‍ය කරවන අර්ථයන් ඉක්මවා යමින් සංකීර්ණ/ ප්‍රබල/ සියුම් නව අර්ථකථනයකින් යුත් නාටකීය අවස්ථාවක්/සිදුවීමක් ගොඩ නැගීම ආශ්‍රිතව සංකීර්ණ මනෝභාවයන්, විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. | මනෝභාවික සංකීර්ණතාවන් මැනවින් පිළිබිඹු වේ. සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් සහ ගොඩනගන අවස්ථාවේ නාටකීය ස්වභාවය හඳුනාගෙන ඒ පිළිබඳ අවබෝධයෙන් යුතු ව එහි මනෝභාවික අන්තර්ගතය පොහොසත් කර තිබේ. | ඉදිරිපත් කිරීමෙහි ඇති මනෝභාවික අන්තර්ගතය සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන්ට බෙහෙවින් අනුකූල වේ. | ඉදිරිපත් කිරීම තුළ මනෝභාවික අන්තර්ගතයක් ඇත. සංගිත ඛණ්ඩයේ මනෝභාවික ලක්ෂණ හා යම් පමණකින් අනුගත ය. | ඉදිරිපත් කිරීම තුළ යම් මනෝභාවික අන්තර්ගතයක් ඇත. එහෙත් එය එක්කෝ සංගීත ඛණ්ඩය හා ඍජු ව අනුගත නැත. නැතහොත් මැනැවින් විශද නො වේ. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කිරීමක් සිදු කළ ද එහි කිසිදු භාවාත්මක අන්තර්ගතයක් නැත. සංගීත ඛණ්ඩයට කිසිදු භාවමය සම්බන්ධයක් නැත. |
| ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය | චලන අතිශයින් ම නිර්මාණාත්මක ය. අවස්ථාවේ නාටකීය බව ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. සංගීත ඛණ්ඩයේ නාදමය සුවිශේෂත්වයන්, සමග අත්‍යන්තයෙන් බැඳුණු, අපූර්ව ශාරීරික ප්‍රකාශනයකි. අවකාශය අර්ථවත් ව, යෝග්‍ය පරිදි භාවිත කරමින් ප්‍රබල දෘශ්‍ය රූප සංරචනයක් නිර්මාණය කෙරේ. | සංගීත ඛණ්ඩයේ නාදමය සුවිශේෂත්වයන්, සමග අත්‍යන්තයෙන් බැඳුණු නිරායාසකර චලන ඉදිරිපත් කරයි. අවස්ථාවේ නාටකීය ස්වභාවය ඉස්මතු කරවන අපූර්ව දෘශ්‍ය රූප සංරචනයන් ඇතුළත් ශාරීරික ප්‍රකාශනයන් සහිතය. . | ශාරීරික ප්‍රකාශනයන් සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්ට, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන්ට සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන්ට බෙහෙවින් අනුකූල වේ. අවකාශය යෝග්‍ය ලෙස භාවිත කරමින් නිර්මාණාත්මක දෘශ්‍ය රූප සංරචනයක් ඉදිරිපත් කරයි. | ඉදිරිපත් කරන ශාරීරික ප්‍රකාශනයන් යම් පමණකින් සංගීත ඛණ්ඩයේ ආකෘතික ලක්ෂණ පිළිබිඹු කරවන සුලු ය. අවකාශ භාවිතය මැනැවින් සිදු නොවේ. | යම් ශාරීරික ප්‍රකාශනයක් ඇතත් සංගීත ඛණ්ඩයට නොගැළපෙන, අනවබෝධයෙන් යුතු ශාරීරික ප්‍රකාශනයකි. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි. / ශාරීරික ප්‍රකාශනයක් නැත. |

## B 2 ඇගැයීම: නාට්‍ය ගීතයක් ගායනයෙන් හා රංගනයෙන් ඉදිරිපත් කිරීම

| ඇගැයීම් නිර්ණායක | 5 - විශිෂ්ට යි | 4 - ඉතා හොඳ යි | 3 - හොඳ යි | 2 - වැඩි දියුණු කළ යුතු යි | 1- දුර්වල යි | 0 - ඉතා දුර්වල යි |
|---|---|---|---|---|---|---|
| සංගීතාත්මක බව, හඬ පාලනය, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණ | විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. තනුව, රිද්මය, ලය, පද මාලාව හා චරිතයට සහ අවස්ථාවට උචිත ස්වර පරාසයත්, හඬ පාලනයත් නිරායාසකර ලෙස මැනැවින් පවත්වා ගනී. ඇතැම් විට මුල් ගීතයට හානිකර නොවන සියුම් නිර්මාණාත්මක එකතු කිරීම් පවා තනුව හා තාලය ආශ්‍රිත ව සිදු කරයි. | ගායනයෙහි තනුව, රිද්මය ලය හා පද මාලාව මුල් ගීතයට අනුකූල ව මුල සිට අග දක්වා ම පවත්වා ගන්නා අතර ම, රංගනයේ හා ශාරීරික චලනයන් ගේ ප්‍රකාශනාත්මක ගුණය ඉස්මතු වන ආකාරයේ ස්වර පරාසයකින් ඉදිරිපත් කරයි. හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත මට්ටමක පවතී. චරිතයේ, අවස්ථාවේ මනෝගතියට උචිත තානීය විවිධත්වයකින් හා හඬ පාලනයකින් සමන්විත ය. | ගායනයෙහි තනුව, රිද්මය හා ලය මුල් ගීතයට අනුකූල ව මුල සිට අග දක්වා ම පවත්වා ගනී. පද මාලාව නිවැරදි ය. ශ්‍රවණය කළ හැකි අතර මනෝභාවික හා ශාරීරික ප්‍රකාශනාත්මක ගුණයන් ඉස්මතුවන සුළු ය. | ගායනයෙහි තනුව හා/හෝ තාලය මුල් ගිතයට අනුව යම් තරමකට පවත්වා ගනී. එහෙත් එය ස්ථාවර නැත. කඩින් කඩ බිඳ වැටෙනසුළු ය. විටින් විට අපස්වර ගැයේ. නැතහොත් රිද්මයෙන් පිට පනී. ඇතැම් විට වචන අමතක වී වැරදි වචන උච්චාරණය වේ. | ගායනය ඉදිරිපත් කළ ද ගීතයෙහි තනුව හෝ තාලය යන දෙකෙන් එකක් වැරදි ය. අපස්වර ස්ථාන බහුල වීම සහ ලය ඉතා මන්දගාමී හෝ අතිශය ශීඝ්‍ර හෝ ඛණ්ඩනය වනු පෙනේ. පදමාලාව මතක නැත. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ගායනා කළ ද තනුව, හා තාලය සපුරා වැරදි ය. |
| මනෝභාවික අන්තර්ගතය | චරිතයේ සංකීර්ණ මනෝභාවයන්, විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයකින් යුතු ව නිරූපණය කෙරේ. සියුම් යටි පෙළ අරුත් ආශ්‍රිත සංකීරණතාවන් ඉස්මතු වන ආකාරයෙන් සහ පෙළෙහි නිරූපිත අදාළ චරිත ස්වභාවයට හානි නොවන ආකාරයේ මනෝභාවික අන්තර්ගතයකින් යුක්ත ය. | මනෝභාවික සංකීර්ණතාවන් මැනැවින් පිළිබිඹු වේ. චරිත ස්වභාවය සහ අවස්ථාව පිළිබඳ අවබෝධයෙන් යුතු ව එහි මනෝභාවික අන්තර්ගතය පොහොසත් කර තිබේ. | ඉදිරිපත් කිරීමෙහි ඇති මනෝභාවික අන්තර්ගතය චරිතයට, අවස්ථාවට, නාට්‍යයට සහ ශෛලියට බෙහෙවින් අනුකූල වේ. චරිත ස්වභාවය සහ අවස්ථාව ඉස්මතු වී පෙනේ. චරිතය තුළ රැඳීසිටීමට උත්සාහ දරයි. | ඉදිරිපත් කිරීම තුළ චරිතයට හා අවස්ථාවට අදාළ මනෝභාවික ලක්ෂණයන් යම් පමණකින් පිළිබිඹු කරයි. | ගායනයේ දී චරිතයේ ඡායාමාත්‍ර මනෝභාවික අන්තර්ගතයක් ඇත. එහෙත් එය චරිතයට හා අවස්ථාවට එතරම් අනුකූල නැත. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කළ ද එහි මනෝභාවික අන්තර්ගතයක් නැත. |
| ශාරීරික ප්‍රකාශනය | චලන අතිශයින් ම නිර්මාණාත්මක ය. චරිතයේ ගැඹුර ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. ගීතයේ රිද්මය හා ලය සමග අත්‍යන්තයෙන් බැඳුණු, නිරායාසකර ශාරීරික ප්‍රකාශනයකි. | චරිතය හා අවස්ථාව සමග අත්‍යන්තයෙන් බැඳුණු නිරායාසකර චලන ඉදිරිපත් කරයි. චරිතයේ අවශ්‍යතාවට, නාට්‍යයේ ශෛලියට, ගීතයේ රිද්මයට හා ලයට අනුකූල ව චලනය විය යුතු ආකාරයන් පිළිබඳ දැනුවත් තෝරා ගැනීම් සහිත ය. | අයදුම්කරු තෝරා ගන්නා ශාරීරික චලන බොහෝ විට චරිතයට හා අවස්ථාවට ගැළපෙන අතර, චරිතය, අවස්ථාව, නාට්‍ය හා ශෛලිය විසින් ඉල්වා සිටිනු ලබන චලන වේ. ගීතයේ රිද්මයට හා තාලයට අනුකූල ය. | අයදුම්කරු ඉදිරිපත් කරන ශාරීරික චලන යම් පමණකින් චරිතය හා අවස්ථාව පිළිබිඹු කරවන සුළු ය. | යම් ශාරීරික ප්‍රකාශනයක් තිබේ. එහෙත් එය ප්‍රමාණවත් නැත. ඉදිරිපත් කළ ද ගීතයට නොගැළපෙන, අනවබෝධයෙන් යුතු ශාරීරික ප්‍රකාශනයකි. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි. / ශාරීරික ප්‍රකාශනයක් නැත. |

Artsopi.lk

## B 3 ඇගැයීම: ගැමි නාටක / ශාන්තිකර්ම ආශ්‍රිත චරිත නිරූපණය

| ඇගැයීම් නිර්ණායක | 5 - විශිෂ්ට යි | 4 - ඉතා හොඳ යි | 3 - හොඳ යි | 2 - වැඩි දියුණු කළ යුතු යි | 1- දුර්වල යි | 0 - ඉතා දුර්වල යි |
|---|---|---|---|---|---|---|
| **චරිතයට අදාළ සංවාද හා ගායනා ආශ්‍රිත කටහඬ, නිපුණතාව** | ශෛලියට අදාලව විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. භාෂණය පහසුවෙන් වටහාගත හැකි ය. ප්‍රකාශන ගුණයෙන් පොහොසත් වේ. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත ය. ගීතයක් වේ නම් තානීය විවිධත්වය නිර්මාණාත්මක ව භාවිත කරයි. තනුව, රිද්මය, ලය, පද මාලාව හා චරිතයට සහ අවස්ථාවට උචිත ස්වර පරාසයත්, හඬ පාලනයත් නිරායාසකර ලෙස මැනැවින් පවත්වාගනී. ඇතැම් විට මුල් ගීතයට හානිකර නොවන සියුම් නිර්මාණාත්මක එකතු කිරීම් පවා ශෛලියට හානිකර නො වන පරිදි තනුව හා තාලය ආශ්‍රිත ව සිදු කරයි. | පැහැදිළි ව හා නිවැරදි ව උච්චාරණය කරයි. හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත මට්ටමක පවතී. ශෛලියට ගැළපෙන, එය මැනැවින් නිරූපණය වන උච්චාරණයකි. ගීතයක් වේ නම් ගායනයෙහි තනුව, රිද්මය, ලය හා පද මාලාව මුල් ගීතයට අනුකූල ව මුල සිට අග දක්වා ම පවත්වා ගන්නා අතර ම, රංගනයේ හා ශාරීරික චලනයන් ගේ ප්‍රකාශනාත්මක ගුණය ඉස්මතු වන ආකාරයේ ස්වර පරාසයකින් ඉදිරිපත් කරයි. | ශෛලියට අනුගත පැහැදිළි හා නිවැරදි උච්චාරණයක් සහිත ය. හඬ ප්‍රක්ෂේපණය පිළිබඳ සැලකිලිමත් වෙමින් ශෛලියට අනුකූලව කටහඬ හසුරුවයි. උචිත හඬ උස් පහත්වීම් සහිත ය. චරිතයට ගැළපෙන උච්චාරණයක් බොහෝ අවස්ථාවල ප්‍රකට කරයි. එහෙත් තානීය විවිධත්වය, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණ විලාසයන් තවත් වැඩිදියුණු කිරීමේ හැකියාව හා කුශලතාව පැහැදිළි ව දක්නට ඇත. ගීතයක් වේ නම් ගායනයෙහි තනුව, රිද්මය හා ලය මුල් ගීතයට අනුකූල ව මුල සිට අග දක්වා ම පවත්වා ගනී. පද මාලාව නිවැරදි ය. ශ්‍රවණය කළ හැකි අතර මනෝභාවික හා ශාරිරික ප්‍රකාශනාත්මක ගුණයන් ඉස්මතුවන සුළු ය. | ශෛලියට අනුකූල ප්‍රකාශනාත්මක ගුණයෙන් යුතු අවස්ථා ඇත. පැහැදිලි උච්චාරණයක් ප්‍රකට කළත් වාක්‍ය/වචන අග දී හඬ වියැකී යයි. මනා හඬ ප්‍රක්ෂේපණයකට යත්න දරයි. චරිතයට අනුකූල උච්චාරණයක් විටින් විට දැකිය හැකි නමුත් ඉන් චරිතය මැනැවින් විශද නො වේ. ගීතයක් වේ නම් ගායනයෙහි දී තනුව හා තාලය මුල් ගීතයට අනුව යම් තරමකට පවත්වා ගනී. එහෙත් එය ස්ථාවර නැත. කඩින් කඩ බිඳ වැටෙන සුළු ය. විටින් විට අපස්වර ගැයේ. නැතහොත් රිද්මයෙන් පිට පනී. ඇතැම් විට වචන අමතක වී වැරදි වචන උච්චාරණය වේ. | උච්චාරණය දුර්වල යි/ ඒකාකාරී තානයකින් යුතු ය/ ප්‍රකාශන ගුණයෙන් හීන ය. හුදු වචන කියවීමකි. ශෛලියට අනුගත නැත. අනවශ්‍ය ලෙස වේගවත් ය/ නැතහොත් මන්දගාමී ය/ අපහසුවෙන් ශ්‍රවණය කළ හැකි ය. අපැහැදිළි ය. උච්චාරණ විලාසය චරිතයට අදාළ නැත. ගීතයක් වේ නම් එහි තනුව හෝ තාලය යන දෙකෙන් එකක් වැරදි ය. අපස්වර ස්ථාන බහුල වීම සහ ලය ඉතා මන්දගාමී හෝ අතිශය ශීඝ්‍ර හෝ බණ්ඩනය වනු හෝ පෙනේ. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නොකර යි/ ඇගැයීම සඳහා කිසිදු සූදානමක් නැත/ ඉදිරිපත් කිරීමක් කළ ද කිසිදු හඬ ප්‍රක්ෂේපණයක් නොවේ |
| **චරිතයට අනුකූල වීම** | අදාළ ශෛලියට අනුකූල පරිදි නළුවා/නිළිය චරිතයට මුළුමණින්ම ස්වීකරණය ඇත. අවස්ථාව පිළිබඳ මනා අවබෝධයකින් රංගනයේ යෙදෙයි. ශෛලියට හානි කර නො වන සහ අදාළ චරිත ස්වභාවයට හානි නොවන එහෙත් ස්වාධීන ගොඩනැංවීමකි. | චරිත ස්වභාවය සහ අවස්ථාව පිළිබඳ අවබෝධයෙන් චරිතය ස්වීකරණය කරගෙන තිබේ. ශෛලියට අනුකූලව එය මැනැවින් නිරූපණය කරයි. | චරිත ස්වභාවය සහ අවස්ථාව ඉස්මතු වී පෙනේ. ශෛලියට අනුකූලව චරිතය තුළ රැඳීසිටීමට උත්සාහ දරයි. | ඉදිරිපත් කිරීම තුළ චරිත ස්වභාවය පිළිබිඹු කිරීමට ප්‍රයත්න දරයි. එහෙත් එය ස්ථාවර නැත. චරිතයේ අනන්‍යතාව පැහැදිළි ව විශද නො වේ. | ඉදිරිපත් කිරීම තුළ චරිතයේ ඡායාමාත්‍රයක් දැකිය හැකි ය. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කළ ද, චරිතය හා අවස්ථාව පිළිබඳ කිසිදු වැටහීමක් නැත. |

ArtSapi.lk

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ශාරීරික ප්‍රකාශනය සහ අවකාශ භාවිතය** | චරිතයට අවස්ථාවට හා ශෛලියට අත්‍යන්තයෙන්ම අනුකූල ලෙස ශාරීරික චලන සහ අවකාශය භාවිත කරන්නේ තම ඉදිරිපත් කිරිම පොහොසත් කිරීම පිලිබඳ මනා දනුවත් භාවයක් හා විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරවමිනි. | චරිතය අවස්ථාව හා ශෛලිය සමග අත්‍යන්තයෙන් බැඳුණු චලන ඉදිරිපත් කරයි. ශෛලියට අනුකූල ලෙස අවකාශය සහ ශරීරය භාවිත කළ යුතු ආකාරයන් පිළිබඳ දැනුවත් තෝරාගැනීම් සහිත ය. | දරුවා තේරාගන්නා ශාරීරික චලන හා අවකාශ භාවිතයන් බොහෝ විට ශෛලියට, චරිතයට හා අවස්ථාවට අනුකූල චලන වේ. | දරුවා ඉදිරිපත් කරන ශාරීරික චලන හා අවකාශ භාවිතය, යම් පමණකින් ශෛලිය, චරිතය හා අවස්ථාව පිළිබිඹු කරවන සුළු ය. | යම් ශාරීරික ප්‍රකාශනයක් සහ අවකාශ භාවිතයක් තිබේ. එහෙත් එය අදාල ශෛලිය සහ චරිතය පිළිබිඹු කිරීමට ප්‍රමාණවත් නැත. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කළ ද ශෛලියට නො ගැළපෙන, අනවබෝධයෙන් යුතු ශාරීරික ප්‍රකාශනයක් සහ අවකාශ භාවිතයකි. |

## C 1 ඇගැයීම: අංග රචන නිර්මාණ සැලසුම

| ඇගැයීම් නිර්ණායකය | 5- විශිෂ්ටයි | 4- ඉතා හොඳයි | 3- හොඳයි | 2- වැඩි දියුණු කළ යුතුයි | 1- දුර්වලයි | 0- ඉතා දුර්වලයි |
|---|---|---|---|---|---|---|
| **ශෛලිය, යුගය, නිෂ්පාදනයේ ස්වරූපය හා කාලීන බව හඳුනා ගැනීම** | ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිලිබඳ මනා අවබෝධයෙන් යුතු අතර ඒවා එකිනෙකට සංගත වන අයුරින් චරිතයට අදාල නිශ්චිත කාල-අවකාශ සබඳතාව නිරීක්ෂණය වේ. | ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිලිබඳ මනා අවබෝධයකින් යුක්ත බව නිරීක්ෂණය වේ. | ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිලිබඳ අවබෝධයකින් යුක්ත බව නිරීක්ෂණය වේ' | ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිලිබඳ යම් අවබෝධයකින් යුක්ත බව නිරීක්ෂණය වුව ද ඒවායෙහි එකිනෙකෙහි පරස්පරයන් ද නිරීක්ෂණය වේ. | සැලසුමක් ඉදිරිපත් කෙරුණ ද ශෛලිය, යුගය හා නිෂ්පාදන ස්වභාවය පිළිබඳ අවබොධයකින් තොර යම් උත්සාහයක් බව පෙනේ. | එක්කෝ කිසිදු සැලසුමක් ඉදිරිපත් කර නැත. නැතහොත් ඉදිරිපත් කළ සැලසුම යෝජිත චරිතයට කිසිසේත්ම අනුකූල නැත. |
| **මුහුණේ කොටස් පිළිබඳ අවබෝධය සහ චරිතයට අදාල සුවිශේෂතා හඳුනා ගැනීම** | මුහුණේ කොටස් හා චරිතයේ ස්වභාවය පිළිබඳ විශිෂ්ට අවබෝධයකින් යුතු ව සැලසුම් කර ඇත. වයස හා සබැඳි සුවිශේෂතා චරිතයට ගැළපෙන ලෙස සැකසී ඇත. | මුහුණේ කොටස් මෙන්ම චරිතයේ මනෝභාවික ස්වරූපය පිළිබඳ මනා අවබෝධයක් ප්‍රදර්ශනය වේ. | මුහුණේ කොටස් මෙන්ම චරිතයේ මනෝභාවික ස්වරූපය පිළිබඳ අවබෝධයක් ප්‍රදර්ශනය වේ. | මුහුණේ කොටස් පිළිබඳ යම් අවබෝධයකින් සැලසුම ඉදිරිපත් කරයි. චරිතයට අදාළ සුවිශේෂතා ඉස්මතු කිරීමට උත්සාහයක් දරා ඇත. | මුහුණේ කොටස් පිළිබඳ නිසි අවබෝධයක් ප්‍රකට නොකරයි. චරිතයේ සුවිශේෂතා පිළිබඳ අවබෝධය ඉතා අල්ප ය. | එක්කෝ කිසිදු සැලසුමක් ඉදිරිපත් කර නැත. මුහුණේ කොටස් පිළිබඳ අවබෝධයකින් තොරය. යෝජිත චරිතයට කිසිදු අනුකූලතාවක් නැත |
| **නිර්මාණ සැලසුම්කරණය හා දෘශ්‍ය සන්නිවේදනය** | දෙන ලද කාලය ඇතුළත සැලසුම් මූලාශ්‍ර (වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර) ඇසුරෙන් චරිත ස්වභාවය මැනැවින් පළිබිඹු වන පරිදි සහ දෘශ්‍ය සන්නිවේදනය පිළිබඳව අවබෝධයෙන් යුතුව නිර්මාණාත්මකව නිර්මාණ සැලසුම කරයි | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර සහ දෘශ්‍ය සන්නිවේදනය පිළිබඳ අවබෝධයෙන් යුතුව චරිත ස්වභාවය මැනැවින් ප්‍රකට වන පරිදි නිර්මාණ සැලසුම සිදු කරයි. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයෙන් යුතුව චරිත ස්වභාවය ප්‍රකට කිරීමට උත්සාහ දරා ඇත. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයක් ප්‍රකට කරයි. එහෙත් ඒවා සංකලනයේ දී දක්නට ඇත්තේ දුර්වල සංගතියකි. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර හසුරුවා ගැනීමට යම් ප්‍රයත්නයක් ඇතත් ඒවායෙහි සංකලනය අතිශයින් දුර්වල ය. | එක්කෝ කිසිදු සැලසුමක් ඉදිරිපත් කර නැත. වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයෙන් යුතුව කටයුතු කර නැත. |

## C 2 ඇගැයීම: රංග වස්ත්‍ර නිර්මාණ සැලසුම

| ඇගැයීම් නිර්ණායකය | 5- විශිෂ්ටයි | 4- ඉතා හොඳයි | 3- හොඳයි | 2- වැඩි දියුණු කළ යුතුයි | 1- දුර්වලයි | 0- ඉතා දුර්වලය |
|---|---|---|---|---|---|---|
| **ශෛලිය, යුගය, නිෂ්පාදනයේ ස්වරූපය හා කාලීන බව හඳුනා ගැනීම** | ඇඳුම් පැළඳුම් ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිළිබඳ මනා අවබෝධයෙන් යුතු අතර ඒවා එකිනෙකට සංගත වන අයුරින් චරිතයට අදාල නිශ්චිත කාල-අවකාශ නිරවද්‍යතාව නිරීක්ෂණය වේ. | ඇඳුම් පැළඳුම් ශෛලිය, යුගය, චරිතයේ කාල-අවකාශ නිරවද්‍යතාව, නිෂ්පාදන ස්වභාවය පිළිබඳ මනා අවබෝධයකින් යුක්ත බව නිරීක්ෂණය වේ. | ඇඳුම් පැළඳුම්, ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිළිබඳ අවබෝධයකින් යුක්ත බව නිරීක්ෂණය වේ. | ඇඳුම් පැළඳුම්, ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිළිබඳ යම් අවබෝධයකින් යුක්ත බව නිරීක්ෂණය වුව ද ඒවායෙහි එකිනෙකෙහි පරස්පරයන් ද නිරීක්ෂණය වේ. | සැලසුමක් ඉදිරිපත් කෙරුණ ද ශෛලිය, යුගය හා නිෂ්පාදන ස්වභාවය පිළිබඳ අවබොධයකින් තොර යම් උත්සාහයක් බව පෙනේ. | එක්කෝ කිසිදු සැලසුමක් ඉදිරිපත් කර නැත. නැතහොත් ඉදිරිපත් කළ සැලසුම යෝජිත චරිතයට කිසිසේත්ම අනුකූල නැත. |
| **සිරුරේ කොටස් පිළිබඳ අවබෝධය සහ චරිතයට අදාල සුවිශේෂතා හඳුනා ගැනීම** | සිරුරේ හැඩය හා චරිතයේ ස්වභාවය පිළිබඳ විශිෂ්ට අවබෝධයකින් යුතුව සැලසුම් කර ඇත. වයස හා සබැඳි සුවිශේෂතා සහ ජවනිකාවේ අවස්ථාවට අනුව චරිතයට ගැළපෙන ලෙස සැකසී ඇත | සිරුරේ හැඩය හා චරිතයේ ස්වභාවය පිළිබඳ අවබෝධයකින් යුතුව සැලසුම් කර ඇත. වයස හා සබැඳි සුවිශේෂතා සහ ජවනිකාවේ අවස්ථාවට අනුව චරිතයට ගැලපෙන ලෙස සැකසී ඇත. | සිරුරේ ස්වභාවය මෙන්ම චරිතයේ මනෝභාවික ස්වරූපය පිළිබඳ අවබෝධයක් ප්‍රදර්ශනය වේ. | සිරුරේ ස්වභාවය පිළිබඳ යම් අවබෝධයකින් සැලසුම ඉදිරිපත් කරයි. චරිතයට අදාළ සුවිශේෂතා ඉස්මතු කිරීමට උත්සාහයක් දරා ඇත. | සිරුරේ ස්වභාවය පිළිබඳ නිසි අවබෝධයක් ප්‍රකට නොකරයි. චරිතයේ සුවිශේෂතා පිළිබඳ අවබෝධය ඉතා අල්ප ය. | එක්කෝ කිසිදු සැලසුමක් ඉදිරිපත් කර නැත. සිරුරේ ස්වභාවය පිළිබඳ අවබෝධයකින් තොරය. යෝජිත චරිතයට කිසිදු අනුකූලතාවක් නැත. |
| **නිර්මාණ සැලසුම්කරණය හා දෘශ්‍ය සන්නිවේදනය** | දෙන ලද කාලය ඇතුළත සැලසුම් මූලාශ්‍ර (වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර) ඇසුරෙන් චරිත ස්වභාවය මැනැවින් පිළබිඹු වන පරිදි නිර්මාණාත්මකව පිරිසැලසුම් කරයි. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයෙන් යුතුව චරිත ස්වභාවය මැනැවින් ප්‍රකට වන පරිදි පිරිසැලසුම සිදු කරයි. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයෙන් යුතුව චරිත ස්වභාවය ප්‍රකට කිරීමට උත්සාහ දරා ඇත. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයක් ප්‍රකට කරයි. එහෙත් ඒවා සංකලනයේ දී දක්නට ඇත්තේ දුර්වල සංගතියකි. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර හසුරුවා ගැනීමට යම් ප්‍රයත්නයක් ඇතත් ඒවායෙහි සංකලනය අතිශයින් දුර්වල ය. | එක්කෝ කිසිදු සැලසුමක් ඉදිරිපත් කර නැත. වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයෙන් යුතුව කටයුතු කර නැත. |

Artsapi.lk

## C 3 ඇගැයීම: වේදිකා පසුතල නිර්මාණ සැලසුම

| ඇගැයීම් නිර්ණායකය | 5- විශිෂ්ටයි | 4- ඉතා හොඳයි | 3- හොඳයි | 2- වැඩි දියුණු කළ යුතුයි | 1- දුර්වලයි | 0- ඉතා දුර්වලය |
|---|---|---|---|---|---|---|
| ශෛලිය, යුගය, නිෂ්පාදනයේ ස්වරූපය හා කාලීන බව හඳුනා ගැනීම | ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිළිබඳ මනා අවබෝධයෙන් යුතු අතර ඒවා එකිනෙකට සංගත වන අයුරින් සහ රංග පරම බවින් යුතුව නිර්මාණ සැලසුම සිදු කර ඇත. | ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පළිබඳ මනා අවබෝධයකින් යුක්ත අතර පසුතලයේ රංග පරම බව නිරීක්ෂණය වේ. | ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිළිබඳ අවබෝධයකින් යුක්ත බව නිරීක්ෂණය වේ. | ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිළිබඳ යම් අවබෝධයකින් යුක්ත බව නිරීක්ෂණය වුව ද ඒවායෙහි එකිනෙකෙහි පරස්පරයන් ද නිරීක්ෂණය වේ. | සැලසුමක් ඉදිරිපත් කෙරුණ ද ශෛලිය, යුගය හා නිෂ්පාදන ස්වභාවය පිළිබඳ අවබෝධයකින් තොර යම් උත්සාහයක් බව පෙනේ. | එක්කෝ කිසිදු සැලසුමක් ඉදිරිපත් කර නැත. නැතහොත් ඉදිරිපත් කළ සැලසුම ශෛලියට, යුගයට, නිෂ්පාදනයේ ස්වභාවයට හා කාලයට කිසිසේත්ම අනුකූල නැත. |
| රංග අවකාශය පිළිබඳ අවබෝධය සහ ජවනිකාවට අදාළ සුවිශේෂතා හඳුනා ගැනීම | රංග අවකාශය හා ජවනිකාවේ ස්වභාවය පිළිබඳ විශිෂ්ට අවබෝධයකින් යුතුව සැලසුම් කර ඇත. ජවනිකාව හා සබැඳි සුවිශේෂතා උචිත පරිදි ගලපාගෙන ඇත. | රංග අවකාශය හා ජවනිකාවේ ස්වභාවය පිළිබඳ මනා අවබෝධයකින් යුතු ය. ජවනිකාව හා සබැඳි සුවිශේෂතා උචිත පරිදි ගලපා ගෙන ඇත. | රංග අවකාශය හා ජවනිකාවේ ස්වභාවය පිළිබඳ අවබෝධයක් ප්‍රදර්ශනය වේ. | රංග අවකාශය හා ජවනිකාවේ ස්වභාවය පිළිබඳ යම් අවබෝධයකින් සැලසුම ඉදිරිපත් කරයි. අවස්ථාවට අදාල සුවිශේෂතා ඉස්මතු කිරීමට උත්සාහයක් දරා ඇත. | රංග අවකාශය හා ජවනිකාවේ ස්වභාවය පිළිබඳ නිසි අවබෝධයක් ප්‍රකට නොකරයි. අවස්ථාවේ සුවිශේෂතා පිළිබඳ අවබෝධය ඉතා අල්ප ය. | එක්කෝ කිසිදු සැලසුමක් ඉදිරිපත් කර නැත. රංග අවකාශය හා ජවනිකාවේ ස්වභාවය පිළිබඳ අවබෝධයකින් තොරය. යෝජිත අවස්ථාවට කිසිදු අනුකූලතාවක් නැත. |
| නිර්මාණ සැලසුම්කරණය හා දෘශ්‍ය සන්නිවේදනය | දෙන ලද කාලය ඇතුළත සැලසුම් මූලාශ්‍ර (වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර) ඇසුරෙන් ජවනිකාවේ අවශ්‍යතාවන් මැනැවින් පිළිබිඹු වන පරිදි නිර්මාණාත්මකව පිරිසැලසුම් කරයි. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයෙන් යුතුව ජවනිකාවේ අවශ්‍යතාවන් මැනැවින් ප්‍රකට වන පරිදි නිර්මාණ සැලසුම සිදු කරයි. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයෙන් යුතුව ජවනිකාව ප්‍රකට කිරීමට උත්සාහ දරා ඇත. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයක් ප්‍රකට කරයි. එහෙත් ඒවා සංකලනයේ දී දක්නට ඇත්තේ දුර්වල සංගතියකි. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර හසුරුවා ගැනීමට යම් ප්‍රයත්නයක් ඇතත් ඒවායෙහි සංකලනය අතිශයින් දුර්වල ය. | එක්කෝ කිසිදු සැලසුමක් ඉදිරිපත් කර නැත. වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයෙන් යුතුව කටයුතු කර නැත. |

Artsapi.lk

## A-1.1/ A-1.2 ඇගැයීම්වල පෙළ ආශ්‍රිත භාෂණ රංගයනයන් සඳහා විෂය නිර්දේශගත නාට්‍ය පෙළවලට අතිරේක වශයෙන් නිර්දේශ කරන භාෂණ කොටස්

### 01. පුංචි පළිඟු රූන- හෙන්රි ජයසේන (පරි)

ටොම් - ඔව්, මගේ සාක්කුවේ තියෙනව නොයෙකුත් විජ්ජා, ඒත් මං විජ්ජාකාරයෙක් නොවෙයි. මං ඒකේ අනිත් පැත්ත. විජ්ජාකාරයා මායාවක් මවා පෙන්වනව ඇත්ත වගෙ. මම ඇත්ත පෙන්වනවා මායාවක් වගේ ලස්සනට සාටෝප කරල.

ආරම්භයක් ලෙස, මම කාලය හරවනවා ආපස්සට. අර තිස් ගණන්වල මහ අමුතු කාලය කරා ආපසු යනව. ඒ කාලෙ තමයි ඇමරිකාව නමැති මහා රාජ්‍යයේ මුළු මැද පන්තියම අන්ධ පාසලක ඉඳන් විභාග සමර්ථ වෙන්ඩ උත්සහ කළේ. එක්කෝ ඒ ගොල්ලගේ දෑස් පෙනුනෙ නෑ. එහෙම නැත්නම් ඇස්වලට ඒ ගොල්ල පෙනුනෙ නෑ. ඉතිං ඒ ගොල්ල මොකද කළේ? දියාරු වෙමින් පවතින ආර්ථිකය නමැති බ්‍රේල් හෝඩියක් මත තමන්ගේ ඇත් ඔබාගෙන සිටිය. ස්පාඤ්ඤයේ විප්ලවයක් තිබුණ. මෙහේ තිබුණෙ කෑ කෝ ගැසීම් හා අන්දුන් කුන්දුන් බව පමණයි.

ස්පාඤ්ඤයේ ගුවර්නිකා තිබුනා. මෙහේ කම්කරු අසහනය තිබුනා. වෙනදා බොහෝම සමකාමී නගරවල, චිකාගෝ, ක්ලිව්ලන්ඩ්, සැන් ලූවී වගේ නගරවල.......... ඒ තමයි නාට්‍යයේ සමාජ පසුබිම.
(සංගීතය)

මේ නාට්‍යය මතකයක්.
මතක නාට්‍යයක් නිසා එහි තිබෙන්නේ දුහුල් ආලෝකයක්.
එය භාවාතිශයයි.
එය තත්වානුරූපී නැහැ.
මතකයේ සෑම දෙයක්ම පාහේ සිදුවන්නේ සංගීත රාවයකට. ඒ හින්දා තමයි අර පැත්තකින් රවිකිඤ්ඤයක් අඬනව ඇහෙන්නේ. මම තමයි නාට්‍යයේ කථක. ඒ වාගේම එහි චරිතයක්. අනෙක් චරිත තමයි මගේ මව අමන්ඩා, මගේ සොයුරිය ලෝරා සහ අවසාන ජවනිකාවේ පෙනී සිටින අමුත්තෙක්. මේ නාට්‍යයෙ එන එකම ස්වාභාවික තැනැත්තා ඔහු පමණයි. ඒ ඔහු සැබෑ ලෝකයෙන්, නැතිනම් පියවි ලොවෙන් දුරස්ථ වෙලයි සිටියේ.
එහෙත් මම මේ චරිතය මේ නාට්‍යයෙදී යොදනව සංකේතයක් ලෙස. ඒ මන්ද, කවි සිතක් තියෙන මා කැමති නිසා, සංකේතවලට. ම මේ කියන අමුත්තා තමයි මේ ජීවිතයේ දී අපි කවුරුත් පාහේ බලාපොරොත්තුවන, ඒත් හැම තිස්සෙම ප්‍රමාද වන, අර මොකක්දෝ සුන්දර සිදුවීම. තවත් චරිතයක් ඉන්නව මේ නාට්‍යයේ. හැබැයි එයා හැබවින් එන්නේ නෑ. ආරුක්කුවට උඩින් එල්ලෙන විශාල ප්‍රමාණයේ පින්තූරයෙන් පමණයි එයා පෙනී සිටින්නේ.
ඒ තමයි අපේ තාත්තා. බොහෝම ඉස්සර දවසක අපව හැර ගිය තාත්තා.
එයා ටෙලිෆෝන් කොම්පැනියක වැඩ කළේ. ඒ නිසාදෝ දුර බැහැර එක්ක පෙමින් වෙළුණු කෙනෙක්.
එයා ටෙලිෆෝන් කොම්පැණියෙන් අස් වෙලා අපේ ටවුමට උඩින් සියුම් මාලක් කමක් දමල ටවුමෙන් පිටවුනා.........

---

### 02. පුංචි පළිඟු රූන- හෙන්රි ජයසේන (පරි)

අමන්ඩා : පොඩ්ඩක් ඉවසලා ඉන්න දුව ඔන්න බලන්ඩ මං පරණ ට්‍රංක පෙට්ටියෙන් ඇදල ගත්තු ඇඳුම! විලාසිතා කියන ඒවා ඒ තරම් වෙනස් වෙන්නේ නෑ!

(ඇතුල් කාමරයේ තිරය විවෘත වෙයි.)

ඔන්න බලන්න දුව අම්මා දිහා!

(ඇය කහ පැහැති වොයිල් ගවුමක් ඇඳ සිටියි. එය ඇය තරුණියකව සිටි අවධියේ අඳින ලද ගවුමකි. බඳ වටා නිල් පැහැ සේද පටියකින් ගවුම ඉනට තද වී ඇත. ඇය අත මල් පොකුරක්ද ඇත. ඇය මොහොතකට තරුණ වූවා සේය,
මේ ගවුම ඇඳ ගෙන තමා කොටිලියන් නැටුමේ පෙර ගමන් කළේ ඒ කාලේ! විලාසිතා සාදවලට ගියේ නීලගිරි ඉසව්වේ ආණ්ඩුකාරයාගේ මන්දිරයේ බාල් නැටුමට ගියේ! ඔන්න බලන්න දුවේ මං නටපු හැටි.

(ඇය ගවුම මදක් ඔසවා සාලයේ වටේ රවුමක් කැරකෙයි.)

Download All Pastpapers from Artsapi.lk

ඒ කාලයේ වැදගත් අමුත්තෝ මාව බලන්න එනකොට මම හිටියෙ මේ ගවුම ඇඳලා. උඹලා තාත්තා

මුණගැහුණු දවසෙත් මම මේ ගවුම ඇඳලා හිටියේ! ඒ මුළු වසන්ත ඍතුවේ මැලේරියා උණ තිබුණා.මට නිතරම පුංචි උණක් තිබ්බා. ඇඳේ ඉන්න තරම් දෙයක් නෙමෙයි. ඒත් ඉහ මොළය රත් කරන කෙල්ලෙක් යාන්තමට පිස්සු වට්ටන උණක්! හැම පැත්තෙන්ම මට ආරාධනා ලැබුණ! හැමදාම වාගේ සාදයක්! ඇඳට වෙලා හිටපන්. උඹට උණ අම්මා කිව්වා! ඒත් මං නෙමෙයි ඇඳට වෙලා හිටියේ! මම ක්විනින් පෙති ගිල ගිල සාදයෙන් සාදයට ගියා. හවස නැටුම් සාද, දවල් වරුවේ කෙලවරක් නැති විනෝද ගමන් .. ඒ පළාත කොච්චර ලස්සනද මැයි මාසේ? හැමතැනම මල් පීදිලා තණ නිල්ල නිල් පලසක් වගේ අපි අස්පය පිටේ විනෝද ගමන් යන කොට අස්පය පිටින් බැහැලා වන වදුලේ වන මල් නෙලන එක! අන්න වන මල කියපු හැටියේ ඉලන්දාරි ටික බැහැල දුවනවා මට වන මල් කඩා දෙන්ඩ! මං වන මල් ගෙනල්ල ගෙනල්ල ගේ පිරෙව්වා. අම්මා කිව්වා දුවේ දැන් නම් ගෙයි ඉඩ නෑ කියල. මං එතකොට ඒවා දෝතෙ දරාගෙන හිටියා......එතකොට තමයි මට උඹලගෙ තාත්තව මුණ ගැහුනෙ.....මැලේරියා උණයි. වනමලුයි අස්සේ එතකොට.....

(ඇය අළුත් කැටයම් පහන දල්වාලයි- සාලය මැදට විත් අත ඇති මල් කළඹ එහි ඇති භාජනයක තැන්පත් කරයි)

මේ ළමයි දෙන්න වැස්සට ඉස්සෙල්ලා එයි කියල මං හිතනව.....මං වැඩිපුර කාසි ටිකකුත් දුන්නා උඹේ මල්ලිට ටැක්සි එහෙක එන්න කියල ! අර, ඕ කෝනර් ළමයත් එක්ක !

## 03. වැනිසියේ වෙළෙන්දා- බන්දුල විතානගේ (පරි)

ෂයිලොක් : ඇන්ටෝනියෝ මහත්තයෝ, නෙක් වර නිරතුරුවම රියැල්ටෝවලදී අපහාස කලා ඔබ මට මගේ මුදල් සහ මගේ පොලිය ගැන.
හැමවිටම එය විඳ දරා ගත්තෙමි මම ඉවසිලිවන්තව. මන්ද පීඩාව සලකුණ බැවින් අපේ වරිගේ හැම එකාගෙම. ඔබ මට කිව්ව මිත්‍යා දෘෂ්ටිකයා ජඩ බල්ලා කියල.
කෙල ගැහුව මගේ යුදෙව් ලෝගුවට.
මේ ඔක්කොම ලබාගත්තට මට උරුම මගේ දෙයක්. හොඳයි එහෙනම් දැන් මට පේන හැටියට ඔබට අවශ්‍යයි මගේ උදව්ව. පලයන් යන්න. මං ළඟට ඇවිත් කියනව උඹ, 'ෂයිලොක් අපට සල්ලි ටිකක් දෙන්න' උඹ කියනව එහෙම,
උඹ කෙළ ගැහුව මගේ රැවුලට,
උඹ මට පයින් ගැහුව පාදඩ බල්ලෙක්ට වගේ, උඹට සල්ලියි ඕනෑ?
මං මොකක්ද උඹට කියන්න ඕනෑ? මං කියන්න ඕනෑ නැද්ද?
'බල්ලෙක්ට කොයින්ද කාසි? බල්ලෙක්ට දෙන්න පුළුවන්ද රන්කාසි තුන්දාහක්,
නැත්නම් මම දෙකට නැමිල වහලෙක් වගේ පහත් ස්වරයෙන් යටහත් පහත්ව කියන්නද?
මෙහෙම 'කරුණාවන්ත මහත්මයාණෙනි, ඔබ මට කෙළ ගැහුව පහුණු බදාදා. මට පයින් ගැහුව අසවල් දා, තවත් දවසක ඔබ මට බල්ලයි කිව්වා, මෙම ත්‍යාගශීලීකම්වලට, මම ඔබට දෙනව සෑහෙන මුදලක් ණයට.'

---

## 04. වැනිසියේ වෙළෙන්දා- බන්දුල විතානගේ (පරි)

ෂයිලොක් : මාළු අල්ලන්න ඇමකට ගන්නවා ඒක. ඒකෙන් කිසිම ප්‍රයොජනයක් නැතැත්, මගේ පලිය ගන්න පුලුවන් ඒකෙන්. ඌ මට නින්දා කළා. කෝටි බාගයක් මට නැති කළා. හිනාවුනා මගේ පාඩුවලට. විහිළු කළා මගේ ආදායමට, පරිභව කළා මගේ ජාතියට, බාධාකළා මගේ ගනුදෙනුවලට, බිඳෙව්වා මගේ, මිතුරන්, කෝප කළා මගේ සතුරන්, මොකක්ද ඔහුගේ හේතුව. මම යුදෙව්වෙක්, යුදෙව්වෙක්ට ඇස් නැද්ද? යුදෙව්වෙක්ට අත් නැද්ද? හැඟීම් නැද්ද? අවයව නැද්ද? දයාව නැද්ද?, ක්‍රිස්තියානිකාරයෙක් වගේ ඔහුත් කන්නේ එකම ආහාර නොවෙයිද, ගොදුරුවන්නේ එකම රෝගවලට නෙමෙයිද? සුව වන්නෙ එකම ප්‍රතිකාරවලින් නෙමෙයිද? උණුසුම් වන්නේත් සිසිල් වන්නේත් එකම වසන්ත හා ශීත ඍතුවලින් නෙමෙයිද? උඹල අපට කිතිකැව්වොත් අපි හිනාවෙන්නේ නැද්ද? උඹලා අපට වහ දුන්නොත් අපි මැරෙන්නේ නැද්ද? උඹලා අපට සමාන නම් අපි ඒකෙදීත් උඹලට සමාන වෙනවා. යුදෙව්වෙක් වරදක් කළා නම් ක්‍රිස්තියාන් කාරයෙක්ට ඔහුගේ මනුස්සකම මොකක්ද? පලිගැනීම. ක්‍රිස්තියානිකාරයෙක් වරදක් කළා නම් යුදෙව්වෙක්ට ක්‍රිස්තියානි ආදර්ශයේ හැටියට ඔහුට ලැබෙන අවසරය මොකක්ද, ඇයි? පළිගැනීම. උඹලා අපට කියාදුන් දුෂ්ඨකම මම ක්‍රියාවට නංවන්නම්.

Download All Pastpapers from Artsapi.lk

## 05. හිරු නැති ලොව - රංජිත් ධර්මකීර්ති (පරි)

මාස්ටර් : ලොකු උන්නැහැ. මගෙ සරුවාංගෙ මද්‍යසාරවලින් විස වෙන්න ඉස්සෙල්ල මට හොඳ සිහි කල්පනාවක් තිබුණා. ඒකටත් එක්ක දැං! දැං හැම දෙයක්ම විනාස වෙලා. ඉස්සර මං ඔය පේලිය කියවනකොට බලන්න එපාය. මුළු ශාලාවම දෙදරුම් කන්න අත්පොලසන් දෙනව! ඔහෙට තේරෙන්නෙ නැහැ ලොකු උන්නැහැ නළුවෙක් අත්පොලසන් නාදයෙන් ලබන සන්තෝෂය. කොටින්ම කියනවනං අත්පොලසන් නාදය හරියට වොඩ්කා වගෙයි! මං එතනට ඇවිල්ලා මෙන්න මෙහෙම හිට ගන්නවා. (එක් විදිහක සිටී.) මම මෙහෙම ඉන්නව.....මෙහෙම. (ඔහු නිහඬ වෙයි) ෂඃ හැබෑවටම එක වචනයක්වත් මතක නැනෙ. එක ම වචනයක්වත් මතක නෑ. ඒක තමයි මම බොහෝම දුර්වලයි. බොහොම දුර්වලයි. එහෙම නේද ලොකු උන්නැහැ?

---

## 06. ගජමන් පුවත- දයානන්ද ගුණවර්ධන

කෝර්නේලියා : මට සමාවන්න, උතුමාණනි, ඔබතුමා මේ විදියට මට දක්වන හිතවත්කම මට ඇස් දෙකෙන් අදහා ගන්න පුළුවන් ද කියලා හිතෙනවා. මං හිතුවා මාව ඉතිං කවදාවත් කිසි ම කෙනෙක් පිළිගන්න එකක් නැහැයි කියලා. කොටින් කියනවා නම් කාව්‍යක්කාරියක් හැටියට පවා මා ගැන තිබුණු මගේ විශ්වාසය පවා මට නැති වෙන්න පටන් ගත්තා. මගේ ඇති වැදගත්කමක් තවත් තියෙනව ද කියලා මට ම ප්‍රශ්නයක් උණා. ඔබතුමාණන්ට පෙත්සම ලියන කොට මම හිටියෙ මගේ ජීවිතය හැම අතින්ම මේ විදියට අවාසනාවන්ත විය යුතු ද යන්න මට ම අවසාන වරට තීරණය කර ගන්න ඕනෑ වුණු අවස්ථාවෙ. කොයි හැටි වෙතත් මට දැන් ධෛර්යයක් ඇති වෙලා තියෙනවා. මට හිතෙනවා. මා නැවතත් ජීවත් වෙනවා කියලා.

---

## 07. සොක්‍රටීස්- සුනන්ද මහේන්ද්‍ර

නිලධාරියා : මේ මරණීය දණ්ඩනයට කැප වූ හැම කෙනෙකුටම විෂ බඳුන පානය කරන්නට අණ කරන්නේ මායි. ඒ හැම අවස්ථාවකම ඒ දණ්ඩනයට කැප වූ අය මට දොස් කීවා. ගැරහුවා. ඒත් ඔබ හැම කෙනෙකුටම වඩා වෙනස්. ඔබ වැනි උත්තම ගනයේ පුද්ගලයෙක් මට කවදාවත් මුණ ගැහී නැහැ. ඔබ වැනි අතිශයින් කාරුණික පුද්ලයෙක් මට කවදාවත් හමු වී නැහැ. ඔබ වැනි නිර්භීත පුද්ලයෙක් හමු වී නැහැ. මා දන්නවා ඔබ මා සමග අමනාප නොවන බව. මා මෙහි පැමිණියේ හුදෙක් රජයේ නියෝගය ක්‍රියාත්මක කිරීමටයි! නියෝගය කෙතරම් දුෂ්ට වුවත් අසාධාරණ වුවත් අකාරුණික වුවත් එය ක්‍රියාවේ යෙදවීමට බොහෝ විට රජයේ නිලධාරීන්ට සිදුවෙනවා. නැතහොත් ඒ හා සමාන දුෂ්ට නියෝග ඒ නිලධාරියාට විරුද්ධව ක්‍රියාත්මක වීමට ඉඩ තිබෙනවා. ඔබ දන්නවා ඇති මා පැමිණි කාරණාව. සියළු දෙයක්ම පහසුවෙන් දරා ගැනීමේ ශක්තිය ඔබට ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා.

නිලධාරියා : පානය කරන්න. ඔබේ දෙපයට බරක් දැනෙන තුරු ඔබ මොබ ඇවිදිමින්, ඉන් පසු බිම වැතිරෙන්න. එවිට මේ විෂ ඔබගේ ශරීරය පුරා ක්‍රියා කරන්නට පටන් ගනිවී.

---

## 08. බර්නාඩාගේ සපිරිගෙය - රංජනී ඔබේසේකර (පරි)

පොන්චියා : ඔව්, ඔව්, මම මුර වැඩට හොඳ බැල්ලියක් තමයි. බුරන්ට කීවාම බුරනවා. උසිගැන්නුවාම හිඟන්නන්ගේ පය විකනවා. මගේ පුත්තු එයාගේ කුඹුරු වැඩ කරනවා තමයි. වාසනාවකට දෙන්නම දැන් පවුල් වෙලා. ඒ කොහොම වුනත් මට නම් දැන් ඇති වෙන්ඩ ලඟයි.

පොන්චියා : එතකොට මං ඇව කාමරයක දාගෙන මූණට කෙළ ගහනවා මුළු අවුරුද්දක් තිස්සේ කෙළ ගහනවා. ඕං බර්නාඩා එදා කළ දේට.... තුං.... මෙන්න අනිත් කළ දේට.... තුඃ මේන් තවත් කළ දේට තුඃ කොල්ලෝ ගල් ගහලා වුරු කරපු කටුස්සියක් වගේ වෙනකං කෙළ ගහනවා. කටුස්සියක් තමයි ඒකි, ඒකියි මුළු හැත්තයි. මං එයාගේ ජීවිතයට ඉරිසියා කරනවා නොවේ. ඔහොම ජීවිතයක් කීයටවත් මට නම් එපා! දූවරු පස් දෙනෙකුගේ බර තවමත් තියෙනවා. ඒ මදිවට රුව නැති දූවරු පස් දෙනෙක්! හැබැයි අන්ගුස්ටියස්ට නම් සල්ලි ටිකක්වත් තියෙනවා. ඉස්සෙල්ලා මිනිහගෙ හින්දා, අනික් අයට ඇත්තෙ මොනවාද? මල් වැඩ මහන්ට රෙදි ගොඩකුයි සේද සායවල් ගොඩකුයි විතරයි. ඇවැද්දට හොඳියි බතුයි තමයි.

පොන්චියා : අපට ඉතින් ඇත්තෙ අපේ අත් දෙකයි. මැරුණම මහපොළවේ වලකුයි විතරයි.

Download All Pastpapers from Artsapi.lk

**<u>09. දොළහක් - සමන් පුෂ්ප ලියනගේ (පරි)</u>**

3 වෙනි ජූරි සභික : හැමදේම. උසාවියේදි අනාවරණය වුන හැමදෙයක්ම. මං කියනව හැමදෙයින්ම කියන්නේ ඒකා වැරදිකාරයා කියලා. මං මෝඩයෙක් කියලද තමුසෙලාගේ හිතේ. තමුසෙලා මේ පපුව උණු වෙලා ලේ ගලන පෙන්දො රැලක්. තමුසෙලට බෑ මාව බය කරන්න. මට මගේ අදහස් දරන්න හිමිකමක් තියෙනවා. මට පුළුවන් මේ ඉලව් කාමරේ අවුරුද්දක් තිස්සේ උනත් ඉන්න.

(පිරිස නිහඬයි)

අර නාකි උන්දෑ කියපුව ගණන් නොගන්නේ ඇයි? එතන හිටියා නාකි මිනිහා. ඒකට සේරම ඇහුණා. නැත්නම් පිහිය ගමු. මොකෝ මෙයාට ඒ ජාතියෙම පිහියක් හම්බ වුන හින්දද? නාකියා දැක්ක ඒකව. හරියටම අර පඩිපෙළේදි. තත්පර කීයක් ගියත් මොකෝ.ඒකා දැක්කනේ. මොකක්ද වෙනස? හැම දෙයින්ම. පිහිය සාක්කුවේ හිලකින් වැටිච්ච එක. තමුසෙලට ඔප්පු කරනන් බෑ නාකියා දොර ලඟට ගියේ නෑ කියලා. තමුසෙලට කාමරේ පුරා නොන්ඩි ගගහ ගිය හැකි හිතේ හැටියට. හැබැයි ඒක ඔප්පු කරන්න බෑ. මං තමුසෙලට කියන්නේ හැමදේම....හැමදේම..කණපිට පෙරලුවනේ මෙතන....දැන් මේ කණ්නාඩි දෙකේ කතාව තමුසෙල දන්නෙ කොහොමද? ඒකි ඒවා දාගෙන හිටියේ නෑ කියලා...ඒ ගෑනි සහතික කරලා කිව්වා උසාවියෙදි...ඉතිං මොනවාද ඕනේ තමුසෙලට....එච්චරයි...ඒක තමයි සම්පූර්ණ කේස් එක......

(පිරිස නිහඬයි)

කොල්ලා කෑ ගහනව ඇහිච්ච එක....කිව්වේ මං තෝව මරණව කියලා..... ඒක තමයි ඌ කිව්වේ උගෙම තාත්තට.ඒ තාත්තා මොන වගේ මිනිහෙක්ද කියන එකෙන් මට ඇති කාරියක් නෑ...ඒ උගේ තාත්තා. ඔය තක්කඩි කොල්ලා මං දන්නවා ඌව. උන් මොක්කුද මොනවද කරන්නේ කියලා....දවස ගානේ උන් අපිව මරණ හැටි....දෙයියනේ තමුසෙලට පේන්නැද්ද? මට විතරද මේක පේන්නේ? දෙයියනේ මට දැනෙනව මගේ පපුවට ඒ පිහිය කිඳා බහිනවා....

---

**<u>10. දිරිය මව- හෙන්රි ජයසේන (පරි)</u>**

චැප්ලේන් : හම්.....මම හිතන හැටියට නම්. යුද්ධයේ වුනත් තියෙනවා එක්තරා සාමයක්. සාමයක්. සාම ක්ෂෙම භූමි වගෙ දේවල් තියෙනව යුද්ධයත්. හැම ඕනෑ එපා කමක්ම පිරිමහනව යුද්ධය - සාමයේ ඕනෑ එපා කම් පවා-ඔව් ඒ හැම එකක්ම සපයනු ලබනවා-එහෙම නැතුව යුද්දෙකට බෑ දිගටම පැවැත්වෙන්ඩ- සාමය ඉහ වහ ගිය කාලෙක වාගේම යුද්දෙකදි වුනත් පුළුවනි එලිබහින්ඩ ගන්ඩ එහෙම. එක සටනක් ඉවර වෙලා අනිත් සටනට ඉස්සර වෙලා බීර වීදුරුවක් බීගන්ඩ පුළුවනි- ගමනේ යන අතර වුනත් පුළුවනි ඇබිත්තකට ඇහැ-පියා ගන්ඩ-සමහර විට කාණු පල්ලක ඉඳගෙන හැම තිස්සෙම පුළුවනි මොන මොනවා හරි කරන්ඩ. ඇත්ත ඇන කොටා ගන්න වෙලාවක බෑ තමයි. බූරුව ගහන්ඩ-එහෙම බලනව නම් සාම කාලෙක කුඹුරක් හාන කොටත් බෑනේ බූරුවා ගහන්ඩ. ඔන්න ජයක් එහෙම ලැබුවට පස්සේ නම පුළුවන් කමක් තියෙනව. අණ්ඩක් දෙකක් කඩාගෙන යනව වෙඩි උණ්ඩෙකට- මොකද කරන්නේ? මුලදි නම් ඉතින් ඔය ගැන සෑහෙන කාලගෝට්ටියක් කරනව. හරියට මහ දෙයක් සිද්ද වුනා වගෙ. පස්සෙ ඒක නිකම්ම නැතිවෙලා යනව. එහෙමත් නැත්නං බ්‍රැන්ඩි උගුරක් බීල අමතක කර දමනව, අන්තිමට එක අණ්ඩෙන් පැන පැන යන්ඩ පුරුදු වෙනව. ඒත් යුද්දෙට අමුත්තක් වෙන්නේ නෑ තමනට ඔය පොඩි අකරතැබ්බයක් වුනාය කියල.ඒ ඇරුනු කොට මිනී මරා ගන්න අස්සෙ වුනත් මිනිස්සු නැද්ද තමන්ගෙ වර්ගයා බෝ කර ගන්ඩ කටයුතු කරන්නෙ? ඔය පිදුරු මඩුවක් හරි මොකක් හරි පිටිපස්සෙ? කොහොමටත් මිනිස්සුන්ට බෑ වැඩි කාලෙකට ඒකෙන් වැලකිලා ඉන්ඩ. එම නිසා, යුද්දෙකදි වුනත් තම තමන්ගෙ පරපුර බෝවෙලා යුද්දෙටම එක් වෙනව! යුද්දයත් හරියට ආලය වගෙ- මොකක් හරි මාර්ගයක් හොයා ගන්නව- කොහොමද ඒක ඉවර වෙන්නෙ?

---

**<u>11. මකරා- හෙන්රි ජයසේන (පරි)</u>**

එලිසා : දෙවියනේ! මගේ කම්මුල් දෙක දනවා! මොන තරම් නින්දාවක්ද? තව ඩිංගෙදි අර තක්කඩියගෙ කතාවට මං රැවටෙනව! එහෙනම් මමත් ඒ විදිහෙ කෙනෙක්! කමක් නෑ - මට දැං හොඳටම එපා වෙලා- කොච්චර අහිංසක. සුවච. කීකරු කෙනෙක් හැටියටද මම මෙච්චර කල් ජීවත්වුනේ! මොකක්ද මට එයින් ඇතිවුනු සෙතේ. හැමෝම කියනව අනේ හරි අහිංසක කෙල්ල කියල! හැබැයි සන්තෝස වෙන්න අනිත් අයයි - දැන් ඒ ගොල්ලො හැමෝම ගෙවල්වල ඇති.මට වෙන්ඩ යන විපත්තිය දිහා බලල විනෝද වෙන්ඩ ඒ ගොල්ලො ලක ලෑස්ති වෙනව ඇති.මට මැවිලා පෙනෙනව කැඩපත් ළඟ

Artsapi.lk
Download All Pastpapers from Artsapi.lk

ඉඳගෙන හැඩ වැඩ දමනව- 'අනේ දුප්පත් එලීසා. අනේ අපූරු කෙල්ල කිය කියා මූණුවල සායම් උලනව ඇති. මම මේ කාන්තාරයක් වාගෙ පිට්ටනියක් මැද තනියම! ඒ අස්සෙ අර තක්කඩි මුර කාරය මා දිහා බලාගෙන ඉන්නව- ගිලගන්ඩ වගේ! අද මකරා මට මොනවා කරයිද කියලා හිත හිතා! ඒ මිනිහා හෙට ජීවතුන් අතර එයාගෙ නිවාඩු දවස විවේකයෙන් ගත කරාවි. දිය ඇල්ල ළඟට යාවි ඇවිදින්ඩ! එතන දිය ඇල්ල නටනව දකිනකොට කොයිතරම් අසරණ මිනිහෙකුගෙ උනත් මූණට හිනාවක් නැගෙනව! එහෙම නැත්නම්, එයා යාවි, ඇලේ ඔරු පදින්ඩ 'අනේ අසරණ එලිසා, මෙච්චර අපූරු වෙලත්, අච්ච ටිකක් තපින්ඩ පුළුවන් කමක් නෑ එයාට කියල කියාවි මිනිස්සු. මටත් ඕනෑ ජීවත් වෙන්න හිරු එලිය එක්ක සන්තෝසෙන් හිනාවෙන්ඩ- හැම දෙයක්ම දකින්ඩ! - අහන්ඩ! මම කිණිස්ස ගෙන මගේම ජීවිතේ තුරන් කරන්ඩ හිතාගෙන- දැං ඉතිං -වෙන දෙයක් උනාවෙ!

හෙන්රි : නෝනාවරුනි, මහත්වරුනි, ප්‍රසිද්ධ කතා පැවැත්වීමට මට ඇති නුහුරුකම නිසා, මගේ කතාවේ කඩතොලු තියන්ඩ පුළුවනි. ඒ ගැන තමුන්නාන්සේලා මට සමාවෙන්ඩ ඕනෑ-මීට හරියට වසරකට පෙර, කොහේද යන අහංකාර නිකමෙක්, අර ඒ කාලෙ හිටපු අපේ එපා කරපු මකරාව සටනකට කැඳෙව්ව - මේ සටන පිළිබඳව පුර සභාව මගින් පත් කරන ලද විශේෂ කමිටුවක්, මෙන්න මේ කරුණු ස්ථිර වශයෙන්ම අනාවරණය කරල තිබෙනව. අර කම්මැලියට පුළුවන් වුනේ මකරාගේ ඇගේ සුළු සීරීමක් ඇති කිරීමට පමණයි. මෙයින් ප්‍රකෝප වූ මකරා, වඩාත් බිහිසුණු වුනා. එවිට අපේ එවකට සිටි පුරවරාධිපති තුමා, දැන් ජනපති තුමා, ඉතා නිර්භීත ලෙස, මකරාගේ ඇඟ උඩට පැනලා, නොයෙකුත් අසාමාන්‍ය වීරක්‍රියා දක්වල, මකරාව මුළුමනින් විනාශ කළා.....

(අත්පොලසන්)

මේ නයින්, අපේ ප්‍රජාවට උරවක්‍ර මාලයක්ව තිබූ වහල් භාවය නමැති බැම්මෙන් අපි සදහටම මිදුනා-

(අත්පොලසන්)

අපේ කෘතඥතාවයේ සළකුණක් වශයෙන් අපේ පුරවරය මේ ආකාරයට තීරණය කළා. අර සාපලත් මකරාට මෙම අඩවියෙන් ඉතාම සුන්දර කන්‍යාවියන් බිලිදෙන සිරිතක් තිබුණ. පසුගිය වර්ෂයේ බිල්ලට නියම වූ මෙම කන්‍යාවිය මකරාගෙ මුවින් ගලවාගත්තේ අපේ මේ නිර්භීත වීරයාටත් අඩු වශයෙන් එම සැළකිල්ලම දැක්වීම, ඉතාම ස්වාභාවික වූත්, සාධාරණ වූත් ක්‍රියාවක් බව මෙම පුරවරය තීරණය කර සිටිනවා.

(අත්පොලසන්)

එම නිසා, මෙම පුරවරයේත්, මගේත්, ඉමහත් කෘතඥතාව පළකරනු වස්. මෙම ස්වාධීන පුරවරයේ නව පුරවරාධිපති වශයෙන් මට ලැබී ඇති බලතල අනුව, මම දැන් චාරිත්‍රානකූල ලෙස මෙම විවාහය සිදුකරනවා. වාදකවරුනි, මංගල සංගීතය!

(වාදනය)

නොතාරිස් වරුනි, මංගල සිදුවීම් පිළිබඳව ලේඛනය විවෘත කරනු!

(විශාල පොතක් සහ පෑන් රැගත් නොතාරිස්වරු පිවිසෙති.)

---

## 12. වෙරි උයන- රංජිත් ධර්මකීර්ති (පරි)

රැනවෙස්කා : මම කොයි තරම් පව්කරපු ගෑනියෙක් ද? මම හරියට පිස්සු ගෑනියෙක් වගේ කිසි ම සැලකිල්ලක් නැතුව හැම තිස්සෙ ම සල්ලි නාස්ති කෙරුව. මාව කසාද බැඳ ගත්ත මනුස්සයත් ඔහේ නිකමෙක් වගෙ හිටිය. එයා කරපු එකම දේ තමයි ණයට වැටුණ එක. මගේ ස්වාමියා ෂැම්පේන් බීල ම මැරිලා ගියා. එයා බීමට නම් රුසියෙක්. ඊට පස්සෙ මගෙ අවාසනාවට මම තවත් මිනිහෙකුට ආදරේ කරන්න පටන් අරගෙන, ඒ මිනිහත් එක්ක දීග ගියා. එතකොට ම තමයි මගේ පළමු දඬුවම - අන්තිම දරුණු හෙණ ගෙඩිය - මගෙ ඉහට පාත් වුණේ. මගේ පුංචි කොලු පැටියා දියේ ගිලිල මැරුණ... ඔය පේන ගඟේ, ඊට පස්සෙ මම කවදාවත් මේ ඉඩමේ පස් නො පාගන්ට හිතාගෙන, මේ ගඟ කවදාවත් මගේ දැහෙට නොපෙනෙන්ට හිතාගෙන, පිටරට ගියා. මම මගේ ඇස්දෙක පියාගෙන හරියට තෝන්තුවාවෙන් වගෙ මේවා ඔක්කොම අතැරල දාල මෙතනින් පලා ගියා. ඒත් අර මිනිහත් මා පස්සෙන්ම දුවගෙන ආව; මට කිසි අනුකම්පාවක් නැතුව. ඒ මිනිහා ලෙඩ වුණා. ඒ පාර මම මෙන්ටොන්වලින් බංගලාවක් එක්ක ඉඩමක් සල්ලිවලට අර ගත්තා. එදා ඉඳලා අවුරුදු තුනක් තිස්සේ අර මනුස්සයට සාත්තු සප්පායම් කරමින් දවල් රෑ දෙකේ ම වෙහෙසෙන්ට වුණා. අර ලෙඩ මනුස්සයා මට දසවද දුන්නා. මගෙ ජීරිමාංශෙත් දිය වෙලා ගියා. මගෙ ණයකුරුස් ගෙවල දාන්න. ගිය අවුරුද්දෙ, ඒ බංගලාවයි ඉඩමයි විකුණලා දාලා මම පැරිසියට ගියා. එහෙදි මාව අන්තිමට නට්ටං කරල, අර මිනිහ මාව දාල වෙනත් ගෑනියෙක් එක්ක යන්න ගියා. ඒ පාර මම වහ බොන්න

Artsapi.lk
Download All Pastpapers from Artsapi.lk

උත්සහ කළා. මේවා ඔක්කොම කොයි තරම් මෝඩ නින්ද සහගත දේවල් ද? එක පාරට ම මට රුසියාව- මගේ මව් රටට මගේ පුංචි කෙල්ලත් එක්කල ආපහු එන්න ආසාවක් ඇති වුණා. (ඇහේ කඳුළු පිස දමමින්) අනේ දෙවියනේ මට කරුණා කරන්න ඕනේ. මගේ පව්වලට සමාව දෙන්න ඕනෙ. මට මීට වැඩිය නම් දඬුවම් කරන්න එපා දෙවියනි. (ඕ සාක්කුවෙන් විදුලි පුවතක් අතට ගනී) මට මේක අදයි ලැබුණේ පැරිසියෙන්. අර මිනිහා මගෙන් සමාව ඉල්ලල ආපහු එහෙ එන්න කියල තියෙනව. (විදුලි පුවත ඉරා දමමින්) සංගීතයක් ඇහෙනව වාගෙ නේද? (ඕ ඊට සවන් දෙයි)

---

## 13. වෙරි චත්ත- රංජිත් ධර්මකීර්ති (පරි)

ට්‍රොෆි : මනුෂ්‍යා වර්ගයා ටිකෙන් ටික පරිසමාප්තියට පත් වෙමින් ඉදිරි ගමනක යෙදිලා ඉන්නව. අපිට අදල බාගන්න බැහැයි කියල හිතන බොහොම දේවල් මිනිස්සුන්ට කවද හරි ලබා ගන්න පුළුවන් වෙනව. ඒත් ඒකට අපි වැඩ කරන්න ඕනෙ. සත්‍ය ගවේෂණයේ යෙදිල ඉන්න මිනිස්සු පිටිපස්සේ වැටිල අපිත් උපරිම ශක්තිමත් යොදවන්න ඕනෙ.දැනට රුසියාවේ ජීවත් වන මිනිසුන් අතරින් වැඩ කරන්නෙ ටික දෙනයි. මම අඳුනන උගත් මිනිසුන්ගේන් වැඩි දෙනා කිසිම අලුත් දෙයක් හොයා ගෙන යන්නෙ නෑ. කිසිම වැඩක් කරන්නෙ නෑ. වැඩ කරන්න අදක්ෂකයි. ඒ කට්ටිය මහ ලොකුවට කියා ගන්නව අපි 'බුද්ධිමතුන්ය' කියල. ඒත් මිනිස්සු තමුන්ගෙ වැඩකාරයන්ට කතා කරන්නෙත් බොහොම සැර පරුෂ විදියටයි. ගොවියන් ට සලකන්නෙ සත්තුන්ට වාගෙයි. කිසි දෙයක් ඉගෙන ගන්නෙ නෑ. වැදගත් යමක් කියවන්නෙ නෑ. ඔහෙ නිකන් උඩ බලාගෙන ඉන්නවා. විද්‍යාව ගැන නම් කතා කරනව. ඒත් කලාව ගැන මෙලෝ හසරක් දන්නෙ නෑ. එක්කෝ දන්න දේ ටිකයි. හැබයි ඒ ගොල්ලෝ බොහොම තැන්පත් ගැඹුරු මිනිස්සු වාගෙ පෙනී හිටින්න හදනව. මූණුවල තියෙන පෙනුම බොහොම බැරෑරුම්. වැදගත් මාතෘකා ගැන කතා කරමින් තමුන් ගෙ දාර්ශනික මතවාද ඉදිරිපත් කරනවා විතරයි. ඒ අතරෙ කම්කරුවො කන්නෙ බොන්නෙ බොහොම තුච්ච විදියට. ඉහට කොට්ටයක්වත් නැතුව කිටි කිටියෙ හිරවෙලා ජරා ගොඩවල්වල නිදා ගන්නවා. එක කාමර කැල්ලක හතලිස් දෙනෙක් විතර එකට ගුලි වෙලා නිදා ගන්නව. හැම තැන ම මකුණො පිරිල. ගඳ ගහනවා, සීතලයි, දුරචාරය. අපේ මේ බුද්ධිමත් සාකච්ඡා අපේ අවධානයක්, අනිත් මිනිසුන්ගෙ අවධානයත් වෙන පැත්තකට හරවන්න විතරයි. ඒ බව නම් ඉතාම පැහැදිලියි. මහ ලොකුවට කතා කරනව ළදරු පාසල් ගැන! කෝ ඒව? පුළුවන් ද මට ඒව පෙන්නන්න ? ඔය කියන කියවීම් ශාලා! කොයි ලොකෙ ද තිනෙනෙ ? ඔව නිකං මිනිස්සු නවකතා වල ලියන දේවල් විතරයි. ඔව නිකං මිනිස්සු නවකතාවල ලියන දේවල් විතරයි. ඔව ඇත්ත ජීවිගේ පවතින දේවල් නොවේ. හැබැහින් තියෙන්නෙ දහජරාව. අශිෂ්ටත්වය, ග්‍රාම්‍යත්වය විතරයි. මම ඔය බැරෑරුම් මුහුණුවලට කැමති නෑ. මට ඒව පෙන්නන බෑ. ඔය ගැඹුරු සාකච්ඡාවලට මම කැමති නෑ. අපි කටවල් වහගෙන ඉන්නව වඩා හොඳයි.

---

## 14. විකෘති - සෝමලතා සුබසිංහ

සරණ : ඒ කාලයේ දොරවක මහා විද්‍යාල පහළ ස්කෝලෙ දක්ෂම ශිෂ්‍යයා මම. ගුරුවරු මට හරි ආදරෙයි. මං පහේ පංතියට පාස් උණාම ලොකු ස්කෝලෙ මහත්තයා කිව්ව මාව ශිෂ්‍යත්වයට තියෙනව කියල. ලොකු ස්කොලෙ මහත්තය මට හැමදාම හවසට වැඩිපුර ඉගැන්නුව. පහේ ශිෂ්‍යත්ව විභගෙ මං ඉහළින්ම පාස් උණා.ලොකු ස්කෝලෙ මහත්තය අපේ අම්මව ස්කෝලෙට ගෙන්නුව."මේ සරණපාල බොහෝම ඉහළින් විභාගෙ පාස් වෙලානෙ. ලොකු හපන්කමක් කරල තියෙන්නේ පුංචි උනාට. මෙයාට යන්න පුළුවන් රටේ ලොකු ලොකු තානාන්තරවල අය ඉගෙන ගත්තු ඉස්කොලෙකට. ඒක තියෙන්නෙ කොළඹ. මෙයාට යන්න අවශ්‍ය මූලික වියදම් උනත් දෙන්න කැමතියි අපේ ගුරු මණ්ඩලය"

එතකොට අපේ අම්ම,

"අනේ මේ හය හතර නොතේරෙන කොල්ල ඔච්චර ඈතක අරින්නේ කොහොමද? වැඳල කියන්නම් ඉස්කෝලෙ මහත්තයො මේකව මේ ස්කෝලෙම තියාගන්න" කිව්ව.

අපේ අම්මල හරි අහිංසකයි. ශිෂ්‍යත්ව විභාග විශ්ව විද්‍යාල ඕව මොනවද ඒ අයට තේරෙන්නෙ නෑ. උඹ දන්නවනෙ අපේ විල්සොන් මාම...? අර පිටකොටුවෙ එළවළු ලෑල්ලක් දාගෙන ඉන්න ඉන්නෙ? මාමා කිව්වා, "අපේ එකෙක් රෝයල් කොලීජියට යනවනම් මොන තරම් නම්බුවක්ද?

උඹට බැරියැ පුතේ එහෙ ඇවිත් ඔය තියෙන විදියකට කාලා බීල ඉන්න" කියලා. මාම විතරක් නෙමෙයි, අපේ මුළු ගමම ආඩම්බර උණා ගමෙන් එකෙක් රෝයල් කොලීජියට යනව කියලා. ඕං ඔහොමයි මං කොළඹට ආවේ.

උසස් පෙළ විභාගයට ඉගෙන ගනිද්දී මහන්සි වෙන්න අවශ්‍ය ප්‍රමාණවත් පාඩම් කරන්න අවශ්‍ය ප්‍රමාණයවත් පාඩම් කරන්න අවශ්‍ය පහසුකම් ගැනවත් අපේ අම්මලට කිසිම අවබෝධයක් නෑ. අනිත් එක මං ඉන්න තැන මට පාඩම් කරන්න තරම් නිස්කලංකයක්වත් නැනේ. ඒත් මං පුළුවං දහිරිය දාලා පාඩම් කළා. ඒත්....

Artsapi.lk
Download All Pastpapers from Artsapi.lk

## 15. තාරාවෝ ඉගිලෙති - ලූෂන් බුලත්සිංහල

පිනා - මාගේ නම පුණ්‍යසිරි! පිනට ශ්‍රියාව වුයේ කිමෙක් ද හෝ පුණ්‍යසිරි නම් වන්නේය! ඒත් ආදරේට මට කියන්නේ පිනා කියලා. සමහරු මට පින්බඩා කියලත් කියනව. මොකද කෑම මේසෙකට වාඩි වෙන්න මට පින පැදුනොත් මගේ බඩට කෑම වැටෙනව දැකල මේසෙ හූල්ලනව. (ප්‍රේක්ෂකයෙකු අමතමින්) ඔහේ කැමතිද ඔහේගෙ පැත්තට තව එක මිනිහෙක් දිනා ගන්න? ඔහෙගෙන් පැනල යන්න හදන මිනිහෙක් දම්වැලකින් වගේ බැඳල තියා ගන්න? ලොක්කෙකුට කියල කරව ගන්න. මෙන්න ටිප් එකක්. හොඳම දේ තමයි කන්න බොන්න දෙන එක. උස්මුරුත්තාවට එනකං කන්න බොන්න දෙන එක. කවදාවත් වෙනස් වෙන්නෙ නැහැ. යන්න ගිය එකා හැරිලා එනව. හැරෙන්න ගිය එකා කැරකිලා එනව. සබ්බේ සත්තා ආහාරට්ඨිතිකා කියල බුදු හාමුදුරුවො කිව්වෙ නිකං නොවෙයි. ආහාරය කියන්නෙ පුදුම හාස්කම් තියෙන බඩුවක්. ඒකෙන් පුළුවන් තියෙන ආණ්ඩු පෙරලන්න. පෙරලුනු ආණ්ඩු පිහිටුවන්න.

ආ...... මං මේ ආවේ මගේ ප්‍රාණ සමාන මිත්‍රයා හොයාගෙන. සිංගප්පුරුවේ ඉන්න සිංහල වෙළෙන්දන්ගෙන් හිත හොඳම එකම එක මිනිහා තමයි මගේ යාලුවා. විජේ. යමක් කමක් තියෙන කොයි මිනිහත් වගේම මගේ යාළුවත් කැමතියි තමන්ගෙ දුක් ගන්නා රාළ කෙනෙක් ලඟින් ඉන්නවට. ඒකට තමයි මේ මං ඉන්නෙ. මොකද මං දුප්පත්. කොයි පෝසත් යාලුවත් දුප්පත් යාළුවෙකුට හුඟක් කැමතියි. කන්න ටිකක් දෙනව. කීයක් හරි අත මිට මොලවනව. පුංචි පහේ උදව්වක් කරනව. දුක සැප බලනව. හැබැයි යාළුවට පෝසත් වෙන මාර්ගය නම් කියල දෙන්නෙ නැහැ. කවදාවත් ඒක දැනගන්න හදන්නත් එපා. නාග මාණික්‍ය උණත් සිතූ පැතූ සම්පත් දෙන්නේ උරගැවහමලු. පෝසත් යාලුවෙකුගෙන් උදව්වක් ගන්නත් පුළුවන් ඒ වගේ මුණ ගැහෙන මුණ ගැහෙන මිනිහ අතේ යාළුවා ගැන ප්‍රශස්ත ගී බන්දල ප්‍රචාරය කරන්න ඕනෙ. විශ්වාස කරන්න මගේ යාළුව කෑම මේසයක් ඇරියොත් ඒක හරියට සූප ශාස්ත්‍රයම ගෙනත් එක තැන ගොඩ ගැහුව වගේ. ඒකෙ උඩම තියෙන දේ ගන්න පුටුවක් උඩට නැගලම බලන්න ඕනෙ. මං කවදාවත් යාළුවගෙ ගෙට ගොඩ වෙන්නෙ නැහැ. මොකද හොඳ යාලුවෙකුට හොඳ ගෑණියෙක් ඉන්න බැරි විත්තිය මං දන්න හින්දා. ආ..... යාලුවගෙ ගෙදර දොර නම් ඇරෙනව. බලමු කව්ද එළියට බහින්නෙ කියල. බොලේ මගෙ යාලුව විජේ නේන්නං.

---

## 16. වෙළෙන්දාගේ මරණය - සේනාරත්න වීරසිංහ (පරි)

බීෆ් - (කලබලයෙන් නැගිටමින්) හැපි මේ අහපන් මං යුද්දෙට ඉස්සර ගෙදරින් ගියදා ඉඳන් නොයෙකුත් ජාතියේ අස්සාවල් විස්සකට තිහකට වඩා කළා. ඒත් ඒ හැම එකක්ම ඉවර උනේ එකම විදියට. මට පස්සෙයි ඒක තේරුම් ගන්ඩ පුලුවන් වුණේ. නැබ්රෙස්කාවලදී මම හරක් රංචුවක් බැලුවා. ඊට පස්සෙ ඩැකෝඩාවලදීත් පස්සේ ඇරිසෝනාවලදීත් ඒ ජොබ් එකම කළා. දැන් ටෙක්සාස්වල කරන්නෙත් ඒකමයි.ඒක මට තේරුම් ගන්ඩ පුලුවන් වුණ හින්දයි ආපහු දමල ගහල ගෙදර ආවේ. මම වැඩ කරපු ගොවිපළට මෙලහකට ගිම්හාන කාලෙ ඇවිත්. බලපන් උන් මෙලහකට අශ්ව නාම්බො පහළොවක් මිලට අරන් වෙළඹගෙයි අශ්ව නාම්බගෙයි දර්ශනය කියන්න බැරි තරම් සුන්දරයි. ඒ වගේ ලස්සන දර්ශනයක් නැවත කිසි කලෙක දක්නට ලැබෙන්නෙ නැහැ. ඒ වගේ මෙලහතට එහෙ හරිම ප්‍රියංකරයි.ඔව්, ටෙක්සාස්වලට මේ තමයි නියම කාලේ. මිහිරැති ගිම්හාන කාලේ. ඉතිං මට වසන්ත කාලේ ළං වෙන කොට හිතෙනව අනේ දෙයියනෙ, මෙහෙට වෙලා තැපිල්ලෙන් කිසි වැඩක් නැහැ කියල. සතියකට ඩොලර් 25ක් හොයා ගන්ඩ අශ්වයො එක්ක ඔට්ටු වෙවී මේ නටන්නේ මොන නාඩගමක්ද කියල හිතෙනව. දැන් මට අවුරුදු තිස් හතරක්. ඉතින් දැන්වත් මම මගේ අනාගතය හදා ගන්ඩ ඕනෑ කියල හිතනව. එහෙම හිතල මම ආපහු ගෙදර දුවගෙන එනව. ඔහොම ඇවිත් මේ ගෙදරට වැදුනට පස්සේ මම කළ යුත්තෙ මොකක්ද කියල අන්දෝසංසාරයක් මට තේරෙන්නේ නැහැ. (සුසුමක් හෙළමින්) මම නිතරම හිතේ තියාගෙන ඉන්නේ නිකරුණේ කාලෙ නාස්ති නොකර මොනව හරි වැඩක් කරන්ඩ ඕනෑ කියල. ඒත් ගෙදරට වැදුන ගමන් මට හිතෙන්නේ මෙච්චර කාලයක් නිකන් නිස්කාරනේ ගෙවල දැම්ම නේද කියල.

බීෆ් - කෙළෙහි ගුණයක් නැති පාහර හැත්ත

ලින්ඩා - ඒ මිනිස්සු පුත්තු තරම් ම කෙළෙහි ගුණයක් නැති අය නොවෙයි. එයා තරුණ කාලෙයි කොම්පැණිය පටන් ගත්තේ. ඒ කාලෙ කොම්පැණිය එයාට හොඳට සලකල තියෙනව.නමුත් එදා එහෙම සලකල ගෞරව කරපු මිනිස්සු දැන් එයාට රිදවනව. නොයෙක් කෙනෙහෙළිකම් කරනව එයා පුරුදු වෙලා හිටියෙ ටෙලිෆෝන් කෝල්වලින් ගණුදෙනු කරන්න. බොස්ටන්වලට දවසට කෝල් හය හතක් දානව. නමුත් දැන් එයාට සිද්ධ වෙලා තියෙනව ඔක්කොම බඩු ටික කාරෙකේ පටවගෙන තැන් තැන් ගානේ අරන් යන්ඩ. එහෙම තැන් තැන් ගානේ ගිහින් ගිහින් දැන් එයා හොඳටම හෙම්බත් වෙලා. ඉතිං එහෙම හැතැප්ම සිය ගණනක් කාරෙක පැදගෙන බඩු ටික එතනට ගෙනෙ ගියාම සමහර ගැනුම් කාරයො එයාව තමන්ගෙ ගණන් ගන්නේ නැහැ. බඩු ටික දිහා ඇස් ඇරලවත් බලන්නේ නැහැ. ඉතිං එහෙම හැතැප්ම සිය ගණනක් කාර් පැදල හිස්

Artsapi.lk
Download Al Pastpapers from Artsapi.lk

අතින් ආපහු ගෙදර එන්ඩ උනාම මිනිහෙකුට මොනව හිතෙනව ඇත්ද? එහෙම එක එයා තමන්ටම කතා කර ගන්න එක අරුමටක්ද? ඇයි? චාලි ළඟට ගිහිල්ල ණයට සල්ලි ඉල්ල ගන මෙන්න මම සතියකට ඩොලර් පණහක් හම්බ කළා කියල නොකිය ඉඳියිද? ඉතිං මෙහෙම තව කොච්චර කාලයක් ගෙවන්නද? කොච්චර කාලයක් දුක් විඳින්ඩද? උඹල දන්නවද මම කොච්චර කාලෙක ඉඳල මේවා උහුලගන ඉන්නවද කියල. ඒ මදිවට උඹල එයා හොඳ මිනිහෙක් නෙවෙයි කියල කියනව. මතක තියා ගනිල්ල එයා කවදාවත් නිවාඩු නොගෙන උඹල වෙනුවෙන් එක දිගට වැඩ කරල තියෙනව. ඒකට එයාට සම්මාන ලැබුණද? ඔව් මේ තමයි ඒකට ලැබුණු එකම සම්මානය. ඔව් අවුරුදු හැටතුනක් තිස්සේ දහදුක් විඳල තමන්ගේ ජීවිතයටත වඩා දරුවන්ට ආදරේ කරල අන්තිමට පුත්තුගෙන් ලැබුණ සම්මානය මේක තමයි. අවලම් බල්ලෝ.....

Download All Pastpapers from Artsapi.lk

අ.පො.ස. උ/පෙළ විභාගය

ප්‍රායෝගික පරීක්ෂණය (නාට්‍ය හා රංග කලාව)

සවිස්තර ලකුණු ප්‍රදාන පත්‍රිකාව (නිදර්ශනාත්මක මූලාකෘතියකි)

විභාග අංකයඃ- ....................................................

| A, B සහ C කොටස්වල ඇගයීම් සඳහා ප්‍රදානය කරන ලකුණු | | | | | | | ඇගයීමට ලැබූ ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| 5- විශිෂ්ට යි / 4- ඉතා හොඳ යි / 3-හොඳ යි / 2-වැඩි දියුණු කළ යුතු යි / 1-දුර්වල යි / 0 -ඉතා දුර්වල යි | 5 | 4 | 3 | 2 | 1 | 0 | |

අයදුම්කරු අනිවාර්යයෙන් ඉදිරිපත් විය යුතු ඇගයීම්

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | ලකුණු |
|---|---|---|---|---|---|---|---|---|
| A-1-1 ඇගැයීම | කටහඬ නිපුණතාව | | √ | | | | | |
| | පෙළ ස්මරණය | | | √ | | | | |
| | චරිත නිරූපණය | | √ | | | | | 16 |
| | ප්‍රේක්ෂක සහසම්බන්ධය | | | | | √ | | |

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | ලකුණු |
|---|---|---|---|---|---|---|---|---|
| A-1-2 ඇගැයීම | කටහඬ නිපුණතාව | | | | √ | | | |
| | භාවාත්මක නිරූපණය | | | | √ | | | 04 |

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | ලකුණු |
|---|---|---|---|---|---|---|---|---|
| A-2 ඇගැයීම | කටහඬ නිපුණතාව | | | | | | | |
| | නාට්‍යෝචිත අවස්ථාව ගොඩනැංවීම | | | | | | | |
| | ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය | | | | | | | |

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | ලකුණු |
|---|---|---|---|---|---|---|---|---|
| A-3 ඇගැයීම | කටහඬ නිපුණතාව | | √ | | | | | |
| | ඉදිරිපත් කිරීමේ නිපුණතාව | | √ | | | | | 13 |
| | ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය | √ | | | | | | |

අයදුම්කරු තෝරාගත් ඇගයීම (තෝරාගත් ඇගයීමට අදාල අවකාශයේ පමණක් ලකුණු සටහන් කළ යුතු ය.)

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | ලකුණු |
|---|---|---|---|---|---|---|---|---|
| B-1 ඇගැයීම | සංගීත ඛණ්ඩයේ සුවිශේෂී ආකෘතික ලක්ෂණ හඳුනාගැනීම | | | | √ | | | |
| | මනෝභාවික අන්තර්ගතය | | | | | √ | | 08 |
| | ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය | | | | √ | | | |

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | ලකුණු |
|---|---|---|---|---|---|---|---|---|
| B-2 ඇගැයීම | සංගීතාත්මක බව, හඬ පාලනය, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය | | | | | | | |
| | මනෝභාවික අන්තර්ගතය | | | | | | | |
| | ශාරීරික ප්‍රකාශනය | | | | | | | |

Artsapi.lk

Download All Pastpapers from Artsapi.lk

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| B-3 ඇගැයීම | චරිතයට අදාල සංවාද හා ගායනා ආශ්‍රිත කටහඬ නිපුණතාව | | √ | | | | | ලකුණු |
| | චරිතයට අනුකූලවීම | | √ | | | | | |
| | ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය | √ | | | | | | |

අයදුම්කරු තෝරාගත් ඇගයීම (තෝරාගත් ඇගයීමට අදාල අවකාශයේ පමණක් ලකුණු සටහන් කළ යුතු ය.)

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| C-1 ඇගැයීම | 1. ශෛලිය, යුගය, නිෂ්පාදනයේ ස්වරූපය හා කාලීන බව හඳුනා ගැනීම | | | | | | | ලකුණු |
| | 2. මුහුණේ කොටස් පිළිබඳ අවබෝධය සහ චරිතයට අදාල සුවිශේෂතා අනුව හඳුනා ගැනීම | | | | | | | 13 |
| | 3. නිර්මාණ සැලසුම්කරණය හා දෘශ්‍ය සන්නිවේදනය | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| C-2 ඇගැයීම | 1. ශෛලිය, යුගය, නිෂ්පාදනයේ ස්වරූපය හා කාලීන බව හඳුනා ගැනීම | | | | | | | ලකුණු |
| | 2. ශරීරයේ කොටස් පිළිබඳ අවබෝධය සහ චරිතයට අදාල සුවිශේෂතා හඳුනා ගැනීම | | | | | | | |
| | 3. නිර්මාණ සැලසුම්කරණය හා දෘශ්‍ය සන්නිවේදනය | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| C-3 ඇගැයීම | 1. ශෛලිය, යුගය, නිෂ්පාදනයේ ස්වරූපය හා කාලීන බව හඳුනා ගැනීම | | | | | | | ලකුණු |
| | 2. රංග අවකාශය පිළිබඳ අවබෝධය සහ ජවනිකාවට අදාල සුවිශේෂතා හඳුනා ගැනීම | | | | | | | |
| | 3. නිර්මාණ සැලසුම්කරණය හා දෘශ්‍ය සන්නිවේදනය | | | | | | | |

| **D කොටස සඳහා ප්‍රදානය කරන ලකුණු** | | | | | | | ඇගයීමට ලැබූ ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| 5- විශිෂ්ට යි / 4- ඉතා හොඳ යි / 3-හොඳ යි / 2-වැඩි දියුණු කළ යුතු යි / 1-දුර්වල යි / 0 -ඉතා දුර්වල යි | 5 | 4 | 3 | 2 | 1 | 0 | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| D ඇගැයීම | B කොටසේ ක්‍රියාකාරකම ආශ්‍රිත දැනුම හා අවබෝධය | | | | √ | | | ලකුණු |
| | C කොටසේ ක්‍රියාකාරකම ආශ්‍රිත දැනුම හා අවබෝධය | | | | √ | | | 04 |


| ඇගැයීම | A-1.1 ඇගැයීම | A-1.2 ඇගැයීම | A-2 ඇගැයීම | A-3 ඇගැයීම | B-....... ඇගැයීම | C-....... ඇගැයීම | D-....... ඇගැයීම | **ලකුණු එකතුව** |
|---|---|---|---|---|---|---|---|---|
| ලබා දිය හැකි උපරිම ලකුණු | 20 | 10 | 15 | 15 | 15 | 15 | 10 | 100 |
| අයදුම්කරු ලබා ගත් ලකුණු | 16 | 04 | 14 | 13 | 08 | 13 | 04 | 72 |

ප්‍රධාන පරීක්ෂක:...................... සහකාර පරීක්ෂක :......................... සහකාර පරීක්ෂක :.........................

Artsapi.lk


Download All Pastpapers from Artsapi.lk

C1 ඇගැයීම අංග රචනා නිර්මාණ සැලසුම




Download All Pastpapers from Artsapi.lk

C2 ඇගැයීම : රංග වස්ත්‍ර නිර්මාණ සැලසුම



Download All Pastpapers from Artsapi.lk

C2 ඇගැයීම : රංග වස්ත්‍ර නිර්මාණ සැලසුම



Download All Pastpapers from Artsapi.lk

C 3 ඇඟැයීම වේදිකා පසුතල නිර්මාණ සැලසුම (ඉහලින් පෙනෙන දර්ශනය) (Birds eye view)

| | | |
|---|---|---|
| ඉහළ වම | ඉහළ මැද | ඉහළ වම |
| දකුණ | මැද | වම |
| පහළ දකුණ | පහළ මැද | පහළ වම |

Artsapi.lk

## C 3 ඇඟැයීම වේදිකා පසුතල නිර්මාණ සැලසුම (ප්‍රේක්ෂකාගාරයේ සිට පෙනෙන දර්ශනය)

(වේදිකාව)



Artsapi.lk